# කාර්යසාධන වාර්තාව 2019

## ග්‍රාමීය ආර්ථික කටයුතු හා පශු සම්පත් සංවර්ධන අංශය

**අංක 80/5,බිම් මහල,ගොවිජන මන්දිරය**
**රජමල්වත්ත පටුමග,බත්තරමුල්ල**

| | |
|---|---|
| **දුරකථන:** | 011-2883791 |
| **ෆැක්ස්:** | 011-2883985 |
| **විද්‍යුත් තැපැල:** | info@reco.gov.lk |
| **වෙබ් අඩවිය:** | www.reco.gov.lk |

# අන්තර්ගතයන්


| | | |
|---|---|---|
| 1. | ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 01 |
| 2. | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 05 |
| 3. | වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 20 |
| 4. | කාර්යසාධන දර්ශක | 25 |
| 5. | තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 25 |
| 6. | මානව සම්පත් පැතිකඩ | 26 |
| 7. | අනුකූලතා වාර්තාව | 30 |

# 2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

**කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශුසම්පත් සංවර්ධන,වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**
**ග්‍රාමීය ආර්ථික කටයුතු හා පශු සම්පත් සංවර්ධන අංශය**
**වැය ශීර්ෂ අංකය - 118**

## 1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. හැඳින්වීම

ග්‍රාමීය ජනතාව ආර්ථිකව නඟාසිටුවීම සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලාධාර සම්පාදනය සහ ග්‍රාමීය යටිතල පහසුකම් හා කුඩා ව්‍යවසාය සංවර්ධනය අරමුණු කර ගනිමින් ග්‍රාමීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම ග්‍රාමීය ආර්ථික කටයුතු උප අංශයේ කාර්යභාරය විය. තවද දීපව්‍යාප්තව ක්‍රියාත්මක විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ජාලය සම්බන්ධීකරණය, ඒවායේ මෙහෙයුම් කටයුතු සහ යටිතල පහසුකම් සංවර්ධනයටද දායක විය. වඩාත් සෞඛ්‍යාරක්ෂිත හා ගුණාත්මක ආකාරයෙන් සත්ත්ව නිෂ්පාදන වෙළෙඳපොලට ඉදිරිපත් කිරීම මගින් ඉහළ යන දේශීය ඉල්ලුම සපුරාලීම හා එමගින් පශු නිෂ්පාදන ආනයනය සඳහා වාර්ෂිකව වැයවන විදේශ විනිමය සීමාකිරීම යන අරමුණු පෙරදැරිව පශු සම්පත් සංවර්ධන උප අංශය විසින් විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.

### 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

#### 1.2.1. දැක්ම

තිරසාර ගැමි ආර්ථිකයක් තුළින් ඉසුරුමත් දැයක්

#### 1.2.2. මෙහෙවර

ග්‍රාමීය ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම උදෙසා ජීවනෝපාය සංවර්ධනය, දේශීය ඉල්ලුමට සරිලන පරිදි ඉහළ ගුණත්වයකින් යුත් පශු සම්පත් නිෂ්පාදන වර්ධනය සහ දේශීය මෙන්ම අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකි අයුරින් සමෘද්ධිමත් දේශීය නිෂ්පාදකයින් බිහිකිරීම

#### 1.2.3. අරමුණු

- ❖ ග්‍රාමීය ජනතාව ආර්ථිකව නගාසිටුවීම සඳහා ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලාධාර සම්පාදනය සහ ග්‍රාමීය යටිතල පහසුකම් හා කුඩා ව්‍යවසාය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම
- ❖ පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ඉහළ නිෂ්පාදන ඵලදායීතාවයකින් සමන්විත සත්ත්ව ගහනයක් ඇතිකරලීම සහ ආහාරයන්හි සෞඛ්‍යාරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික මගපෙන්වීම හා සහය ලබාදීම
- ❖ නිරෝගිමත් සත්ත්ව ගහනයක් ඇතිකරලීම සඳහා ගුණාත්මක සත්ත්ව ආහාර ප්‍රචලිත කිරීම සහ සත්ත්ව රෝග වලක්වාලන හා මර්දනය කරන කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම

- ❖ පශු සම්පත් මගින් ඉහළ නිෂ්පාදන ධාරිතාවයක් ලබා ගැනීම සඳහා ඉහළ ගුණත්වයකින් යුත් සත්ත්ව ජාන සම්පත් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම ප්‍රචලිත කිරීම සහ දේශීය සත්ත්ව ප්‍රභේදයන් වැඩිදියුණු කිරීම
- ❖ පශු සම්පත් නිෂ්පාදන අලෙවිකරණය, සැකසීම සහ අගය එකතු කිරීම වැඩිදියුණු කිරීම සඳහා විධිමත් අලෙවි ජාලයන් ඇති කිරීමට අදාළ පාර්ශවයන් දිරි ගැන්වීම
- ❖ දේශීය කිරි ගොවීන් ශක්තිමත් කරමින් දියර කිරි නිෂ්පාදනයේ ඉලක්කගත වර්ධනය සාක්ෂාත් කර ගැනීමට දිරිදීම
- ❖ තොග වෙළෙඳුන් හා පාරිභෝගිකයින්, කෘෂි නිෂ්පාදකයින් සමඟ සම්බන්ධ කිරීම තුළින් දේශීය කෘෂි නිෂ්පාදන මිල තිරසාර මට්ටමක පවත්වා ගැනීමේ අරමුණින් විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම

## 1.3. ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් 2018 දෙසැම්බර් 28 දිනැති අංක 2103/33 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික කටයුතු හා පශු සම්පත් සංවර්ධන අංශය වෙත පවරා ඇති කාර්යයන් හා කර්තව්‍යයන් පහත දක්වා ඇත.

- ❖ ග්‍රාමීය ආර්ථික කටයුතු හා පශු සම්පත් සංවර්ධන විෂයයට සහ ඊට අදාළව ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම සහ ඇගයීම
- ❖ ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ❖ ප්‍රාදේශීය සහ ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්ති සහ උපායමාර්ගික සංවර්ධනය
- ❖ ග්‍රාමීය යටිතල පහසුකම් සහ කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු
- ❖ ග්‍රාමීය ආර්ථික කටයුතු සඳහා මූල්‍යාධාර සම්පාදනය
- ❖ පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම
- ❖ සත්ත්ව සුභසාධනය හා ඒ සම්බන්ධ කටයුතු
- ❖ පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය, ප්‍රචාරණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම
- ❖ නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම හා එහි ප්‍රතිඵල මත නිපැයුම් ක්ෂේත්‍රය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම
- ❖ පශු සම්පත් ක්ෂේත්‍රයේ සත්ත්ව ගහනය වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ කිරීමේ ක්‍රම ප්‍රචලිත කිරීම සහ එම සතුන් රෝගවලින් ආරක්ෂා කිරීම හා නිරෝධායන කටයුතු

## 1.4. සංවිධාන සටහන


ලේකම්
අතිරේක ලේකම් (පාලන හා මුදල්) (ශ්‍රී.ලං.ප.සේ.විශේෂ ශ්‍රේණිය) 01
ප්‍රධාන මූල්‍ය නිලධාරි (ශ්‍රී.ලං.ග.සේ.විශේෂ ශ්‍රේණිය) 01
අතිරේක ලේකම් (පශු සම්පත් සංවර්ධන) (ශ්‍රී.ලං.ස.නි.සෞ.සේ. විශේෂ ශ්‍රේණිය) 01
අතිරේක ලේකම් (සංවර්ධන හා සැලසුම්) (ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණිය) 01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) (ශ්‍රී.ලං.ප.සේ.) 01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පශු සම්පත් පාලන) (ශ්‍රී.ලං.ප.සේ.) 01
ප්‍රධාන ගණකාධිකාරි (ශ්‍රී.ලං.ග.සේ) 01
අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ස.නි.සෞ.සේ.) 03
අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ) 02
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ක්‍ර.සේ) 01
සිවිල් ඉංජිනේරු (ශ්‍රී.ලං.ඉ.සේ) 01
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී.ලං.ග.සේ) 01
නීති උපදේශක
සහකාර ලේකම් (පාලන) (ශ්‍රී.ලං.ප.සේ) 01
සහකාර ලේකම් (කම්කරු සබඳතා) 01
සහකාර ලේකම් (පශු සම්පත් පාලන) (ශ්‍රී.ලං.ප.සේ.) 01
ගණකාධිකාරි (ප්‍රසම්පාදන) (ශ්‍රී.ලං.ග.සේ.) 01
ගණකාධිකාරි (ගෙවීම්) (ශ්‍රී.ලං.ග.සේ.) 01
නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ 04 පශු වෛද්‍ය 04 (ශ්‍රී.ලං.ස.නි. සෞ.සේ.)
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) (ශ්‍රී.ලං.ප.සේ.) 02
නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) (ශ්‍රී.ලං.ක්‍ර.සේ) 03
තාක්ෂණ නිලධාරීන්
පරිපාලන නිලධාරි
භාෂා පරිවර්තක
සංවර්ධන නිලධාරි හා සමාන්තර සේවා
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
කළමනාකරණ සහකාර
නිශ්චල ඡායාරූප ශිල්පී
රියදුරු
කා.සේ.සේ
සංවර්ධන නිලධාරි හා සමාන්තර සේවා
කළමනාකරණ සහකාර
කා.සේ.සේ
සංවර්ධන නිලධාරි හා සමාන්තර සේවා
කළමනාකරණ සහකාර
කා.සේ.සේ
සංවර්ධන නිලධාරි හා සමාන්තර සේවා
කළමනාකරණ සහකාර
කා.සේ.සේ
සංවර්ධන නිලධාරි හා සමාන්තර සේවා
කළමනාකරණ සහකාර
කා.සේ.සේ
සංවර්ධන නිලධාරි හා සමාන්තර සේවා
කා.සේ.සේ
සංවර්ධන නිලධාරි හා සමාන්තර සේවා
කළමනාකරණ සහකාර
කා.සේ.සේ
නීති නිලධාරි
නීති සහකාර
කා.සේ.සේ

### 1.5. ග්‍රාමීය ආර්ථික කටයුතු හා පශු සම්පත් සංවර්ධන අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1.6. ග්‍රාමීය ආර්ථික කටයුතු හා පශු සම්පත් සංවර්ධන අංශය යටතේ පවතින ආයතන/අරමුදල්

- විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන
- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
- මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
- සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම
- සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම
- ග්‍රාමීය පුණර්ජීවන අරමුදල
- ග්‍රාමීය ආර්ථික පුණර්ජීවන අරමුදල (මූලා)
- ජනදිරිය අරමුදල (ග්‍රාමෝදය මණ්ඩල අරමුදල)

} අක්‍රිය තත්වයේ පවතී*

** 2019.02.26 දිනැති අංක 2112/13 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශය වෙත මෙම අරමුදල් ත්‍රිත්වය පවරා ඇත.*

### 1.7. විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ඇස්තමේන්තුගත වියදම (රු.මි.) | කාල සීමාව |
|---|---|---|---|---|
| 01 | බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම | ඩෙන්මාර්ක් රජය | 11,783.00 | 2016-2020 |
| 02 | කිරි ගවයින් 20,000ක් ආනයනය | ඕස්ට්‍රේලියා රජය | 11,170.00 | 2017-2020 |
| 03 | කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම | ප්‍රංශ රජය | 4,086.00 | 2018-2021 |
| 04 | කෘෂිපාදක කර්මාන්ත සහ කෘෂි නිෂ්පාදන අලෙවි යටිතල පහසුකම් ප්‍රවර්ධන ව්‍යාපෘතිය | චීන මහජන සමූහාණ්ඩුව | 38,123.31 | * |
| 05 | මඩකලපුව දිස්ත්‍රික්කයේ මහජන සෞඛ්‍යය වැඩිදියුණු කිරීම සඳහා ඉන්දියානු රජයේ ප්‍රදානයන් යටතේ සනීපාරක්ෂක ඒකක 3,400 ක් ඉදිකිරීම** | ඉන්දියන් රජය | 360.00 | 2020 |

*චීන රජය හා ශ්‍රී ලංකා රජය අතර මූලා ගිවිසුම අත්සන් කර නැති බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොමැත. සිව් අවුරුදු කාල සීමාවක් තුල ව්‍යාපෘතිය නිමකිරීමට සැලසුම් කර ඇත.

** මෙම ව්‍යාපෘතියට අදාළ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත.

# 2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1. පශු සම්පත් සංවර්ධන උප අංශය

***2019 වර්ෂය තුළදී පශු සම්පත් සංවර්ධන උප අංශය මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය (දෙසැම්බර් 31 දිනට)***

| අනු අංකය | වැඩසටහන / ව්‍යාපෘතිය | 2019 අයවැය ප්‍රතිපාදන (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|
| 1. | දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීම | 20.0 | 60 | 14.09 | තවත් රු.මි.1.26 ක මුදලක් ප්‍රතිපූර්ණය කිරීමට ඇත |
| 2. | අභිජනන ගොවිපොළවල් ස්ථාපනය කිරීම | 20.0 | 92 | 18.78 | තවත් රු.මි.0.8ක මුදලක් ප්‍රතිපූර්ණය කිරීමට ඇත |
| 3. | පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන | 20.0 | 75 | 15.31 | තවත් රු.මි.4.95ක මුදලක් ප්‍රතිපූර්ණය කිරීමට ඇත |
| 4. | කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළවල් ඇති කිරීම | 5.0 | 94 | 3.56 | තවත් රු.මි.0.58ක මුදලක් ප්‍රතිපූර්ණය කිරීමට ඇත |
| 5. | ශ්‍රී ලංකාවේ සූකර කර්මාන්තය නගාසිටුවීම | 3.0 | 98 | 2.26 | තවත් රු.මි.0.89ක මුදලක් ප්‍රතිපූර්ණය කිරීමට ඇත. |
| 6. | බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම (ශ්‍රී ලංකා / ඩෙන්මාර්ක්) | 800.0 | 87 | 627.60 | - |
| 7. | ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන | 120.0 | 85 | 77.61 | තවත් රු.මි.29.03ක මුදලක් ප්‍රතිපූර්ණය කිරීමට ඇත. |
| 8. | කිරි ගවයින් 20,000ක් ආනයනය (ශ්‍රී ලංකා / ඕස්ට්‍රේලියා) | 3,140.0 | 80 | 3,033.24 | - |
| 9. | කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම (ශ්‍රී ලංකා /ප්‍රංශ) | 2,065.0 | 65 | 1,965.76 | - |
| | එකතුව | **6,193.0** | | **5,758.21** | |

### 2.1.1. දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන

#### 2.1.1.1. දිළිඳුබව තුරන්කිරීම උදෙසා කාන්තා මූලික කිරි නිෂ්පාදනය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය

පශු සම්පත් ක්ෂේත්‍රයේ නියැලී සිටින බහුතරයක් සුළු පරිමාණ කිරි ගොවීන් වන අතර, ඒ සඳහා කාන්තාවන් වැඩි ශ්‍රම දායකත්වයක් ලබාදේ. මෙම ව්‍යාපෘතිය යටතේ කාන්තා මූලික පවුල් විසින් පවත්වාගෙන යනු ලබන කිරි ගොවිපොළ සඳහා 50 % ක රජයේ දායකත්වයක් යටතේ රුපියල් 80,000 ක උපරිමයකට යටත්ව උසස් ආරයේ කිරි ගවයෙකු ලබාදීම සහ කාන්තා මූලික කිරි සැකසුම් මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම වෙනුවෙන් 50 % ක රජයේ දායකත්වයක් යටතේ රුපියල් 100,000 ක උපරිමයකට යටත්ව කිරි සැකසීමේ උපකරණ ලබා දීම තුළින් එම කාන්තාවන් සවිබල ගැන්වීම හා දිළිඳුකම තුරන් කිරීම සඳහා ද මනා පිටුවහලක් සපයයි.

පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු හරහා ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ දිවයින පුරා ප්‍රතිලාභීන් 36 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබා දීමට ඉලක්ක කර තිබූ අතර, 2019 වසර සඳහා ව්‍යාපෘති 34 ක් සම්පූර්ණ කරන ලදී.

## 2.1.2. අභිජනන ගොවිපොළවල් ස්ථාපනය කිරීම

### 2.1.2.1. අභිජනන ගොවිපොළවල් පිහිටුවීම

දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය උසස් ආරයේ කිරි දෙනුන්ගේ හිඟකම මගහරවා ගැනීමේ අරමුණින් දිවයින පුරා පළාත් මට්ටමින් අභිජනන ගොවිපොළවල් පිහිටුවීම සිදුකරන ලදී. 2019 වසර තුළ සත්ත්ව අභිජනන ගොවිපොළ 40 ක් පිහිටුවීමට සැලසුම් කර තිබූ අතර, මේ සඳහා අපේක්ෂිත ආයෝජනය රු.මි. 4 කි. ඉලක්කගත ගොවිපොළවල ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. අභිජනනය සඳහා සුදුසු සතුන් මිලදී ගැනීම සහ ගවගාල් සැකසීමද මේ යටතේ සිදුකරන ලදී. මේ සඳහා වැය කරන ලද මුළු පිරිවැය රු.මි. 4 කි.

*2019 වසර තුළ ක්‍රියාත්මක අභිජනන ගොවිපොළ සංඛ්‍යාව*

| පළාත | අභිජනන ගොවිපොළ | |
|---|---|---|
| | ඉලක්කය | ක්‍රියාත්මක කරන ලද සංඛ්‍යාව |
| මධ්‍යම | 05 | 05 |
| නැගෙනහිර | 03 | 03 |
| උතුර | 05 | 05 |
| උතුරු මැද | 05 | 05 |
| වයඹ | 05 | 05 |
| සබරගමුව | 02 | 02 |
| දකුණ | 05 | 05 |
| ඌව | 05 | 05 |
| බස්නාහිර | 05 | 05 |
| **එකතුව** | **40** | **40** |

## 2.1.3. පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන

පශු සම්පත් ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා උතුරු පළාතෙහි පවතින විශාල විභවය තුළ පශු වෛද්‍ය කාර්යාල හා අනෙකුත් යටිතල පහසුකම් ස්ථාපනය කිරීම මගින් පශු සම්පත් ක්ෂේත්‍රයේ සේවා සැපයුම වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත. සමාලෝචිත කාල සීමාව තුළ ඉදිකරන ලද නිල නිවාස හා කාර්යාල පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| නිල නිවාසය | භෞතික ප්‍රගතිය (%) |
|---|---|
| කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චායි පශු වෛද්‍ය නිල නිවාසය | 100 |
| වවුනියා දිස්ත්‍රික්කයේ ඉරට්ටපෙරියකුලම් පශු වෛද්‍ය නිල නිවාසය | 100 |
| මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම පශු වෛද්‍ය කාර්යාල ගොඩනැගිල්ල | 50 |
| යාපනය දිස්ත්‍රික්කයේ තිරුණවේලි බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම | 15 |



*කිලිනොච්චි පශු වෛද්‍ය නිල නිවාසය*



*වවුනියා පශු වෛද්‍ය නිල නිවාසය*

### 2.1.4. සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධන වැඩසටහන

කුකුළු නිෂ්පාදනයන්ගෙන් රට ස්වයංපෝෂිත කර අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගනිමින් කටයුතු කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මේ යටතේ, නව ව්‍යවසායකයින් කුකුළු පාලන ක්ෂේත්‍රය සඳහා යොමු කිරීමත්, දැනට සිටින ව්‍යවසායකයින් දිරිමත් කිරීමත් සිදුකරන අතර බිත්තර, කුකුළු මස් හා සත්ත්ව ආහාර නිෂ්පාදනය මෙන්ම කුකුළු පැටවුන් නිෂ්පාදනය ප්‍රචලිත කිරීමත් අපේක්ෂා කෙරේ. සෑම පුද්ගලයෙකුටම සතියකට බිත්තර 03 ක් සහ වසරකට කුකුළු මස් කිලෝ ග්‍රෑම් 10 ක් පරිභෝජනය කිරීමට හැකිවන පරිදි කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහන මගින් බලාපොරොත්තුවේ.

2019 වසර තුළදී සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ 375 ක් ස්ථාපනය කිරීමට ඉලක්ක කරන ලද අතර, සමාලෝචිත කාල සීමාව තුළදී රු.මි. 1.484 වැය කර සුළු පරිමාණ ගොවිපොළ 415 ක් පිහිටුවා ඇත. කුඩා පරිමාණ සත්ත්ව ආහාර නිෂ්පාදනාගාර 05 ක් හා මස් සකස් කිරීමේ මධ්‍යස්ථාන 08 ක් ස්ථාපනය කිරීමට රු.මි.1.946 ක මුදලක් ආයෝජනය කරන ලදි.

### 2.1.5. ශ්‍රී ලංකාවේ සූකර කර්මාන්තය සංවර්ධන වැඩසටහන

සමාලෝචිත කාල සීමාව තුළදී දිපව්‍යාප්තව පවතින කුඩා පරිමාණ සූකර ගොවිපොළ 54 ක් පරිසර හිතකාමී තත්ත්වයට නගාසිටුවීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, මේ සඳහා රු.මි. 2.691 ක මුදලක් ආයෝජනය කරන ලදි. 2018 වර්ෂයේ අවසාන කිරීමට නොහැකි වූ වයඹ පළාතේ වන්නිගම ඒකාබද්ධ ගොවිපොළ සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ පවතින ආදර්ශ සූකර ගොවිපොළෙහි සුළු පරිමාණ සූකර ඝාතකාගාරයක් ඉදිකිරීමට රු. මි. 0.449ක මුදලක් ආයෝජනය කර ඇත.



*සුළු පරිමාණ සූකර ඝාතකාගාරයක්*

### 2.1.6. බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම

මිල්කෝ සමාගමට අයත් කොළඹ නාරාහේන්පිට පිහිටි කිරි සැකසුම් කර්මාන්තශාලාව, බඩල්ගම පිහිටි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් සිරිංගපාත ගොවිපොළෙහි ස්ථාපනය කිරීමට තීරණය කරන ලදී. මෙම ව්‍යාපෘතිය ඩෙන්මාර්ක් රජයේ සහයෝගීතාව මත ක්‍රියාත්මක වන අතර,එහි පළමු අදියර යටතේ, කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා 2016.05.18 දින මුල්ගල තැබීම සිදු කරන ලදී. සමාලෝචිත කාල සීමාව අවසන් වනවිට අත්කර ගෙන ඇති ප්‍රගතිය පහත පරිදිවේ

| කාර්යය | භෞතික ප්‍රගතිය (%) | ආයෝජනය |
|---|---|---|
| කිරි කර්මාන්තශාලා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු | 99 | |
| පරිපාලන හා කාර්යාල ගොඩනැගිල්ල | 99 | |
| ආපන ශාලාගොඩනැගිල්ල, සේවක පහසුකම් ඇතිකිරීම | 98 | |
| කාර්යමණ්ඩල නිල නිවාස සහ ආරක්ෂක කුටි ඉදිකිරීම | 99 | |
| විදුලි ජනන ඒකකය ස්ථාපිත කිරීම | 100 | |
| යාන්ත්‍රික සහ විදුලි ආශ්‍රිත සවිකිරීම් කටයුතු | 75 | |
| යන්ත්‍රෝපකරණ කොටස් සහ ඉදිකිරීම් ද්‍රව්‍ය බහාලුම් 54 ක් ආනයනය කිරීම | | යුරෝ මිලියන 58.91 |
| ආනයනික යන්ත්‍රෝපකරණ සඳහා දේශීය අරමුදලින් බදු ගෙවීම | | රු.මි.206.56 |





ඉදිවෙමින් පවතින බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානය සහ සවි කරන ලද යන්ත්‍ර උපකරණ වලින් කොටසක්

### 2.1.7. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන

ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ පහත සඳහන් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර ඇත.

#### 2.1.7.1. කුඩා පරිමාණ කිරි ගොවිපොළ සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනෙහි ප්‍රතිපාදන යටතේ කුඩා පරිමාණ කිරි ගොවිපොළවල ගුණාත්මක කිරි නිෂ්පාදනය දිරිගැන්වීමේ අරමුණින් මෙය ක්‍රියාත්මක කෙරේ. එක් ප්‍රතිලාභියෙකු වෙත රුපියල් 80,000 ක උපරිමයකට යටත්ව සියයට 50 ක සහනාධාර මුදලක් මේ යටතේ ලබාදේ. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු සහ මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් හරහා ක්‍රියාත්මක කරන මෙම ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත කාල සීමාව තුළ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු මගින් ව්‍යාපෘති 461 ක් සහ මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් මගින් ව්‍යාපෘති 30 ක් ක්‍රියාත්මක කරන ලදී.

### 2.1.7.2. කුඩා පරිමාණ එළු ගොවිපොළ සංවර්ධන ව්‍යාපෘතිය

කුඩා පරිමාණ එළු පාලනයේ නියුතු ගොවීන්ගේ ආර්ථිකය නගාසිටුවීම සහ දේශීය එළු කිරි හා එළු මස් නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් ජනතාවගේ පෝෂණ මට්ටම වැඩිදියුණු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ, එළු ගොවිපොළවල් 292 ක් පිහිටුවීම සඳහා රු.මි.17.5 ක් ආයෝජනය කර ඇත. මෙහිදී එක් ප්‍රතිලාභියෙකු වෙනුවෙන් පිරිමි සතෙකු හා ගැහැණු සතුන් 04 හෝ 05 දෙනෙකු මිලට ගැනීම සඳහා රුපියල් 60,000 ක මුදලක් ලබා දෙන ලදි.

### 2.1.7.3. කුඩා පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධන ව්‍යාපෘතිය

කුකුළු නිෂ්පාදන සඳහා ගෘහස්ථ මට්ටමේ දායකත්වය ලබාදීම තුළින් ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ, එක් ප්‍රතිලාභියෙකු වෙත මසක් වයසැති කිකිළි පැටවුන් 10 ක් බැගින් ලබාදෙන අතර, ප්‍රතිලාභීන් විසින් කුකුළු නිවාසය සාදාගැනීම හා සතුන් සඳහා අවශ්‍ය ආහාර ලබාදීම සිදුකළ යුතුවේ.

මේ යටතේ, සමාලෝචිත කාල සීමාව වනවිට සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළවල් 7,085ක් දීපව්‍යාප්තව ස්ථාපිත කර ඇත. මේ සඳහා රු. මි.28.592 ක් ආයෝජනය කර ඇත.



*ප්‍රතිලාභීන් වෙත කුකුළු පැටවුන් ලබාදීමේ අවස්ථාවක්....*

### 2.1.8. කිරිගවයින් 20,000ක් ආනයනය කිරීම

දේශීය දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් උසස් ආරයේ ගැබ්බර කිරි දෙනුන් 20,000 ක් ඕස්ට්‍රේලියාවෙන් හා නවසීලන්තයෙන් ආනයනය කිරීමට අපේක්ෂිතය. මේ තුළින් කිරි ගව පාලනයේ නිරතවන මධ්‍ය හා මහා පරිමාණ ව්‍යවසායකයින් වෙත මෙම එළදෙනුන් ලබා දී වඩා කාර්යක්ෂම හා ගුණාත්මක කිරි නිෂ්පාදනයක් ඇති ගොවිපොළවල් දීපව්‍යාප්තව පිහිටුවීමට බලාපොරොත්තුවේ.මෙම සතුන්ගෙන් ජනිතවන පළමු පරම්පරාවේ පැටවුන් නිෂ්පාදන කටයුතුවලට යොදවා ගැනීමට මෙන්ම දේශීය ආරයන් වැඩිදියුණු කරගැනීමට දායක කර ගැනීමටද අපේක්ෂිතය.

ඒ අනුව, මෙම ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ 2017 මැයි මාසයේ දී කිරි ගවයින් 2,000 ක් නවසීලන්තයෙන්ද, දෙසැම්බර් මස කිරි ගවයින් 3,000ක් ඕස්ට්‍රේලියාවෙන්ද ආනයනය කරන ලදුව එම සතුන් සමස්ත ආයෝජකයින් 68 දෙනෙකු වෙත ලබා දී ඇත. 2019.07.31 වන විට පැටව් උපත් 5,650ක් සිදුවී ඇති අතර 2017 අගෝස්තු සිට 2019 අප්‍රේල් දක්වා කාලය තුළ දේශීය කිරි නිෂ්පාදනයට කිරි ලීටර් මිලියන 21.12ක ප්‍රමාණයක් දායක කර ඇත.

### 2.1.9. කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිති සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය නඟාසිටුවීමේ අරමුණින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ අගය එකතු කල කිරි නිෂ්පාදන අදාළ ප්‍රදේශවලම නිෂ්පාදනය කර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම මගින් ප්‍රජාවේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමය. මේ යටතේ තෝරාගත් කුඩා පරිමාණ කිරි සැපයුම් මධ්‍යස්ථාන 06 ක් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන අතර, මේ සඳහා අපේක්ෂිත ආයෝජනය යුරෝ මිලියන 13.9 කි.

ව්‍යාපෘතියට අදාළ මූල්‍ය ගිවිසුම 2018/09/28 දින අත්සන් තැබූ අතර සැපයුම් කොන්ත්‍රාත් ගිවිසුම 2019.02.27 අත්සන් කරන ලදි. මෙම ව්‍යාපෘතියට අදාළ උපකරණ ආනයනය කර කිරි සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම සඳහා මූලික වැඩ කටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී

## 2.2. පශු සම්පත් සංවර්ධන උප අංශය මගින් 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති

2019 වසරේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් 2020 වසරේදී ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

ඊට අමතරව, 2020 වසර සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව සංවර්ධන ව්‍යාපෘතිය ඒකාබද්ධ අරමුදල මගින් මූල්‍යනය කරන අතර, ඒ පිළිබඳ විස්තර පහත පරිදිවේ.

| ව්‍යාපෘතිය | කාල සීමාව | ඇස්තමේන්තු ගත මුදල (රු.මි.) | අරමුණු හා ප්‍රතිලාභ | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ආකාරය |
|---|---|---|---|---|
| පොකුරු ගම්මාන ව්‍යාපෘතිය (එළු, ඌරු, කුකුළු) | 2020 ජන.-දෙසැ. | 12.0 | පොදු ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම සඳහා සත්ව පාලනයේ යෙදීම හා දිරිගැන්වීම | පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හරහා |

## 2.3. ග්‍රාමීය ආර්ථික කටයුතු උප අංශය

මෙම අංශය මගින් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

1. ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන
   - ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය
   - ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය

2. සාම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධන වැඩසටහන
   - සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය
   - මැටි ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය
   - කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය

### 2.3.1. ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන වැඩසටහන -2019

ග්‍රාමීය ජනතාව නඟාසිටුවීම මෙන්ම නාගරික හා අර්ධ නාගරික කලාපවල අඩු ආදායම්ලාභී ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වේ. සමාලෝචිත වර්ෂය තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය අරමුදලින් රු.මි.270.00ක ප්‍රතිපාදන ලබා දී ඇත.

ප්‍රජා සහභාගිත්ව ක්‍රමවේදය අනුව ගමේ සංවර්ධනය කළ යුතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම, කුඩා පාලම්, බෝක්කු, කාණු පද්ධති ඉදිකිරීම් හා නවීකරණය කිරීම්,පොදු පානීය ජල සම්පාදනය,පානීය ළිං අළුත්වැඩියා කිරීම,බහුකාර්ය ගොඩනැගිලි හා වෙනත් පොදු ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම වැනි සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කෙරේ.

ග්‍රාමීය ව්‍යවසායකයන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව, උපකරණ, තාක්ෂණය හා පහසුකම් ලබාදීම ග්‍රාමීය සංවර්ධන ඉලක්ක ළඟා කරගැනීමෙහිලා අත්‍යවශ්‍ය සාධක වේ. ඒ තුළින් ආදායම් උත්පාදනය, ස්වයංරැකියා සඳහා ජනතාව යොමු කිරීම, ග්‍රාමීය නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා ලැබෙන සහය වැදගත්ය. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් හඳුනාගනු ලැබූ ග්‍රාමීය ව්‍යවසායකයින් හට වගා කටයුතු සඳහා ජල මෝටර්, කෘෂිකාර්මික කටයුතු සඳහා තණකොළ කපන යන්ත්‍ර,මහන මැෂින්, ධීවර ආම්පන්න වැනි උපකරණ ලබා දීමට කටයුතු කර ඇත.

අනුරාධපුර, පොළොන්නරුව, මඩකලපුව, මුලතිව්, ගාල්ල, මොණරාගල, රත්නපුර, කළුතර, පුත්තලම හා මාතලේ යන දිස්ත්‍රික්ක තුළ මෙම ව්‍යාපෘතිය 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදි. ප්‍රාදේශීය ලේකම්වරුන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් මගින් හඳුනාගනු ලබන ව්‍යාපෘති යෝජනා සඳහා වෙන්කරනු ලබන ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරු වෙත යොමු කර ඇත. ඒ අනුව 2019 වර්ෂයේදී ග්‍රාමීය යටිතල පහසුකම් ව්‍යාපෘති 108ක් සාර්ථකව නිමකර ඇති අතර එමගින් ප්‍රතිලාභීන් 28,899කට පහසුකම් සැලසී ඇත. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 3,653ක් සහය ලබාදී ඇත. ග්‍රාමීය දිළිඳුබව අවම කිරීම ,ග්‍රාමීය ව්‍යවසායකයන් ශක්තිමත් කිරීම,ආදායම් උත්පාදනය,ස්වයංරැකියා සඳහා ජනතාව යොමුකිරීම මගින් මගින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම තුළින් යහපත් ආර්ථිකයක් හා ජීවන රටාවක් සම්පාදනය කිරීමට මෙම වැඩසටහන මගින් කටයුතු කර ඇත.

***2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය***

| # | දිස්ත්‍රික්කය | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති | | | | | ජීවනෝපාය සංවර්ධන කටයුතු | ප්‍රතිපාදන (රු.මි.) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මාර්ග සංවර්ධනය | පානීය ජල ව්‍යාපෘති/ වගා ළිං | අමුණු, බෝක්කු හා කානු ඉදි කිරීම | ප්‍රජා ශාලාවේ වැඩ නිම කිරීම | ප්‍රතිලාභින් සංඛ්‍යාව | උපකරණ බෙදා දුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | අනුමත ප්‍රතිපාදන | වියදම | අතැති බිල්පත් |
| 01 | අනුරාධපුර | 10 | 10 | 02 | 02 | 3,800 | 25 | 94.0 | 14.1 | 6.7 |
| 02 | මඩකලපුව | 18 | - | - | - | 6,400 | 2,200 | 59.7 | 57.5 | 20.6 |
| 03 | මොණරාගල | 07 | 01 | - | - | 3,955 | 316 | 10.0 | 9.8 | 1.7 |
| 04 | පොළොන්නරුව | 02 | 01 | - | - | 903 | 400 | 9.9 | 9.8 | 3.2 |
| 05 | ගාල්ල | 09 | 01 | 01 | - | 2,225 | - | 10.0 | 8.9 | 2.5 |
| 06 | පුත්තලම | - | - | - | 01 | 99 | 640 | 10.0 | 9.3 | 5.5 |
| 07 | රත්නපුර | 08 | - | 02 | - | 5846 | - | 10.0 | 9.6 | 6.1 |
| 08 | කළුතර | 09 | - | 02 | - | 360 | - | 9.9 | 9.2 | 5.6 |
| 09 | මුලතිව් | 08 | 01 | - | - | 3895 | 50 | 10.0 | 9.0 | 4.3 |
| 10 | මාතලේ | 10 | 01 | 01 | - | 1416 | 22 | 10.0 | 7.6 | 2.3 |
| | එකතුව | **81** | **15** | **09** | **03** | **28899** | **3653** | **233.5*** | **144.8** | **58.9** |

**2019 වර්ෂය සඳහා ලබා දී ඇති රු.මි.270ක ප්‍රතිපාදන වලින් රු.මි.36.5ක මුදලක් 2018 වර්ෂයේ මෙම වැඩසටහනට අදාළ අතැති බිල්පත් ගෙවීම සඳහා වැය කර ඇත.*




*ඉදි කරන ලද වගා ළිඳක්....*



*ප්‍රජා ශාලාවේ ඉතිරි වැඩ කටයුතු සම්පූර්ණ කිරීම - මහනෙළුබැව*

*ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ලබා දී ඇති උපකරණ හා පුහුණු වැඩසටහන්*

| # | දිස්ත්‍රික්කය | ජීවනෝපාය සංවර්ධන කටයුතු මගින් අදාළ දිස්ත්‍රික්ක වෙත ලබා දී ඇති උපකරණ | | | | | | | | පුහුණු වැඩසටහන් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මල් වගාව/ එළවළු වගාව සඳහා උපකරණ | ධීවර ආම්පන්න | වඩු උපකරණ | තණකොළ කපන යන්ත්‍ර | දියර ඉසින යන්ත්‍ර | මහන මැෂින් | රූපලාවන්‍ය උපකරණ | වෙනත් ස්වයංරැකියා උපකරණ | බර වාහන පුහුණුව | වෙනත් |
| 01 | අනුරාධපුර | 10 | - | - | - | - | - | 15 | - | - | - |
| 02 | මඩකලපුව | 317 | 298 | 45 | - | 169 | 450 | 35 | 692 | - | 500 |
| 03 | මොණරාගල | 25 | - | 50 | 75 | 100 | 50 | - | - | 16 | - |
| 04 | පොළොන්නරුව | - | - | - | 200 | 100 | - | - | 90 | - | - |
| 05 | පුත්තලම | 100 | 50 | 50 | 75 | 100 | 50 | - | 215 | - | - |
| 06 | මුලතිව් | - | 25 | 5 | 20 | - | - | - | - | - | - |
| 07 | මාතලේ | - | - | 15 | - | - | - | - | 7 | - | - |
| | එකතුව | **452** | **373** | **165** | **370** | **469** | **550** | **50** | **1,004** | **16** | **500** |

## 2.3.2. සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම

මෙම ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයට රුපියල් මිලියන 20 ක ප්‍රතිපාදන දේශීය අරමුදල් මගින් ලබා දී ඇත. සාම්ප්‍රදායික හස්ත කර්මාන්තකරුවන් සඳහා නව තාක්ෂණික දැනුම ලබාදීම තුළින් නව නිර්මාණකරණයේ යෙදීම සඳහා ඉඩ ප්‍රස්ථා ලබාදීම, වෙළඳපොළ ශක්තිමත් කිරීම හා වැඩිදියුණු කළ නිෂ්පාදන අලෙවිය සඳහා යොමු කිරීම හා නවීන උපකරණ හඳුන්වාදීම, පාරම්පරික කර්මාන්ත හා ශිල්පීය කුසලතා සඳහා නව තාක්ෂණික වටිනාකමක් ලබාදීම, හස්ත කර්මාන්තවල නියුක්ත වූවන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සහ හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ.

දීපව්‍යාප්තව තෝරාගත් දිස්ත්‍රික්ක 13ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 53 ක් ආවරණය වන පරිදි සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීමට කටයුතු කර ඇත. මේ යටතේ ප්‍රාදේශීය ලේකම්වරුන් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා අනුව හඳුනාගනු ලැබූ සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පුහුණුව, තාක්ෂණික දැනුම, අමුද්‍රව්‍ය ලබාදීම,අමු ද්‍රව්‍ය වගා කිරීම සඳහා අවශ්‍ය සහය ලබාදීම, උපකරණ හා භාණ්ඩ ලබාදීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද කර්මාන්ත පහත සඳහන් වේ.

| සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත සංවර්ධනය යටතේ හඳුනාගෙන ඇති ක්ෂේත්‍රයන් - 2019 වර්ෂය | | | |
|---|---|---|---|
| පාපිසි නිෂ්පාදන කර්මාන්තය සංවර්ධනය | ස්වර්ණාභරණ නිෂ්පාදනය | පන් ගම්මාන සංවර්ධනය | චිත්‍ර මූර්ති කැටයම් ශිල්පීන් සංවර්ධනය |
| කොහු ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය | පිත්තල කර්මාන්තය සංවර්ධනය | වේවැල් ආශ්‍රිත නිෂ්පාදන | උණ ලී ආශ්‍රිත නිර්මාණ |
| පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන | බතික් කර්මාන්තය | තවාසි බුරුසු නිෂ්පාදනය | ගල් කැටයම් නිර්මාණ ශිල්පීන් සංවර්ධනය |
| කම්මල් කර්මාන්තය සංවර්ධනය | බීරළු රේන්ද කර්මාන්තය සංවර්ධනය | ලුහු කර්මාන්ත සංවර්ධනය | තල් ආශ්‍රිත නිෂ්පාදන |
| ලාක්ෂා කර්මාන්ත ශිල්පීන් | කලාල පැදුරු කර්මාන්තය සංවර්ධනය | වෙස්මුහුණු කර්මාන්ත සංවර්ධනය | දැව ආශ්‍රිත නිර්මාණ සංවර්ධනය |

**සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය - 2019.12.31 දිනට ප්‍රගතිය**

| # | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ගම්මාන සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | මූල්‍ය ප්‍රගතිය (රු.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගාල්ල | හබරාදූව,යක්කලමුල්ල, කඩවත්සතර ගාල්ල, ගෝනාපීනුවල ,ඉමදූව හික්කඩුව,බෝපෙපෝද්දල බෙන්තොට,අම්බලන්ගොඩ බද්දේගම | 12 | 232 | 3,951,370.00 | 3,786,970.38 | 100% |
| 2 | කුරුණෑගල | ඉබ්බාගමුව,කොටවෙහෙර ගල්ගමුව,කුරුණෑගල පොල්පිතිගම,නිකවැරටිය වාරියපොළ,මාස්පොත ගනේවත්ත,පන්නල | 12 | 124 | 2,216,705.00 | 1,718,020.00 | 98% |
| 3 | පුත්තලම | හලාවත , මුන්දලම | 2 | 25 | 147,980.00 | 144,025.00 | 90% |
| 4 | මොණරාගල | කතරගම, මොණරාගල | 2 | 18 | 392,940.00 | 378,764.00 | 100% |
| 5 | හම්බන්තොට | අම්බලංතොට ,සූරිය වැව බෙලිඅත්ත,කටුවන,තංගල්ල | 15 | 192 | 3,092,105.00 | 2,998,199.00 | 96% |
| 6 | මහනුවර | යටිනුවර , උඩුදුම්බර | 11 | 40 | 857,180.00 | 811,128.96 | 95% |
| 7 | මාතර | තිහගොඩ,පිටබැද්දර කිරින්දපුහුල්වැල්ල දික්වැල්ල,හක්මණ,වැලිපිටිය මුලටියන , කඹුරුපිටිය | 13 | 247 | 4,195,955.00 | 4,181,498.00 | 100% |
| 8 | අනුරාධපුර | පලුගස්වැව | 1 | 20 | 408,245.00 | 400,000.00 | 98% |
| 9 | කෑගල්ල | කෑගල්ල, දෙහිඕවිට, රුවන්වැල්ල | 7 | 37 | 1,469,385.00 | 739,253.28 | 96% |
| 10 | පොළොන්නරුව | දිඹුලාගල | 4 | 8 | 82,155.00 | 80,600.00 | |
| 11 | කළුතර | අගලවත්ත,පානදුර බණ්ඩාරගම | 6 | 48 | 678,400.00 | 508,328.00 | 96% |
| 12 | මඩකලපුව | එරාවූර් නගර, වවුනතිව්, මන්මුනේපත්තු | 05 | 62 | 1,265,335.00 | 1,038,093.50 | 97% |
| 13 | යාපනය | කරෙයිනගර්, සන්දිලිප්පායි, කරවෙඩ්ඩි | 03 | 72 | 683,540.00 | 478,390.00 | 73% |
| එකතුව | | | 93 | 1125 | 19,441,295.00 | 17,378,420.00 | |




*තල් කොළ ආශ්‍රිත අත්කම් නිර්මාණාත්මක පුහුණු වැඩසටහන - තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*

### 2.3.3. මැටි භාණ්ඩ නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරීම

ග්‍රාමීය මැටි නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත කාර්මිකයින් දිරිගැන්වීම, මැටි කර්මාන්තකරුවන් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කිරීම, වෙළෙඳපොළ අරමුණු කර ගත් නිෂ්පාදන හඳුන්වාදීම තුළින් වෙළෙඳපොළ අවස්ථා වැඩිදියුණු කිරීම සහ අඩු ආදායම්ලාභී මැටි කර්මාන්තකරුවන් සඳහා උපකරණ ලබාදීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ.

මෙම ව්‍යාපෘතිය සඳහා දේශීය අරමුදලින් රුපියල් මිලියන 10ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය සඳහා ලබා දී ඇත. කුරුණෑගල, හම්බන්තොට,පොළොන්නරුව,කෑගල්ල,මාතලේ, පුත්තලම,අනුරාධපුර, රත්නපුර, බදුල්ල, මඩකලපුව,කළුතර සහ මහනුවර යන දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා අනුව මැටි ගම්මාන ශක්තිමත් කිරීම සඳහා ආයෝජනයන් සිදු කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකළ ක්‍රියාකාරකම් පහත දැක්වේ.

- සාම්ප්‍රදායික මැටි වළං කර්මාන්තයේ නියැලි කර්මාන්තකරුවන් සඳහා පුහුණුව ලබාදීම
- මැටි කර්මාන්තකරුවන්ට නවීන තාක්ෂණය ලබාදීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා මැටි අඹරන යන්ත්‍ර ලබාදීම
- මැටි කර්මාන්තකරුවන් සඳහා විදුලි සකපෝරු ලබාදීම
- මැටියෙන් තනන ලද ගෑස් වළං නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර, උපකරණ හා අච්චු ලබාදීම
- මැටි වළං ආශ්‍රිත කර්මාන්තකරුවන්ට වෙළෙඳපොළ සහය ලබාදීම සඳහා අලෙවි මධ්‍යස්ථාන හඳුන්වාදීම
- මැටි කර්මාන්තකරුවන් අලෙවි ප්‍රදර්ශන වෙත යොමුකිරීම තුළින් ඔවුන් දිරිගැන්වීම

මෙම ව්‍යාපෘතිය මගින් දිවයිනේ දිස්ත්‍රික්ක 12ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 33 ක ප්‍රතිලාභීන් 380 දෙනෙකු සඳහා සිදුකළ සංවර්ධන කටයුතු පහත දැක්වේ.

### *මැටි භාණ්ඩ නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරීම - 2019.12.31 දිනට ප්‍රගතිය*

| # | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ගම්මාන | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | මූල්‍ය ප්‍රගතිය (රු) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 1 | කුරුණෑගල | පන්නල | 1529 -වේරහැර | 15 | 439,885.00 | 431,000.00 | 96% |
| | | නාරම්මල | තලහේන ගම්මානය | 7 | 403,145.00 | 395,000.00 | 96% |
| | | උඩුබද්දාව | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 10 | 510,310.00 | 500,000.00 | 94% |
| | | වීරඹුගෙදර | කණුමලේ | 2 | 86,750.00 | 85,000.00 | 100% |
| | | කොබෙයිගනේ | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 10 | 204,125.00 | 200,000.00 | 100% |
| | | අලව්ව | මැද්දේගොඩ | 4 | 163,300.00 | 160,000.00 | 100% |
| | | රස්නායකපුර | සුධීරගම | 5 | 372,525.00 | 365,000.00 | 95% |
| | | බිංගිරිය | ඌරාපොත්ත | 10 | 479,690.00 | 470,000.00 | 100% |
| | | පඩුවස්නුවර (බටහිර) | මැදගම | 20 | 408,245.00 | 406,183.75 | 95% |
| 2 | හම්බන්තොට | වලස්මුල්ල | බිබුලගොඩ | 10 | 686,750 .00 | 678,000.00 | 95% |
| | | වීරකැටිය | බුද්ධියාගම උතුර,යක්ගස්මුල්ල, උඩුකිරිවිල | 37 | 956,430 .00 | 923,500.00 | 94% |
| | | තංගල්ල | රන්න නැගෙනහිර රන්න බටහිර, ඉහළගොඩ | 5 | 122,475 .00 | 120,000.00 | 100% |
| | | ලුණුගම්වෙහෙර | රණවරණාව | 8 | 163,300 .00 | 160,000.00 | 100% |
| 3 | පොළොන්නරුව | ඇළහැර | අංක 06 කුමාරඇල්ල | 5 | 127,575 .00 | 90,165.00 | 92% |
| | | දිඹුලාගල | ඉහළවැව | 3 | 61,235 .00 | 60,125 | 100% |
| 4 | කෑගල්ල | අරණායක | දූල්දෙණිය හා කීරපන | 22 | 224,535.00 | 220,000.00 | 100% |
| | | වරකාපොළ | අඹේපුස්ස, වරකාපොළ, නෙළුන්දෙණිය, වෙනිවැල්කඩුව, තෝල්ංගමුව | 5 | 178,610.00 | 178,505.00 | 100% |
| 5 | මාතලේ | ගලේවෙල | ලේනාවල | 6 | 204,125.00 | 197,660.00 | 99% |
| 6 | පුත්තලම | මාදම්පෙ | 544 ගල්මුරුව උතුර | 2 | 76,545.00 | 75,000.00 | 100% |
| | | මුන්දලම | පුලිච්චාකුලම | 12 | 306,185.00 | 298,000.00 | 99% |
| | | ආණමඩුව | වඩක්කරවැව | 5 | 102,060.00 | 101,550.00 | 100% |
| 7 | අනුරාධපුර | තිරප්පනේ | 545 ඉහළ අඹතලේ තුලානේ පණ්ඩිත රඹෑව | 20 | 408,245.00 | 400,000.00 | 98% |
| | | කැබිතිගොල්ලෑව | කුරුළුගම | 15 | 306,185.00 | 300,000.00 | 100% |
| | | කහටගස්දිගිලිය | ශූල්නෑව | 20 | 408,245.00 | 400,000.00 | 99% |
| | | තඹුත්තේගම | මැහිඇල්ලෑව | 20 | 408,245.00 | 400,000.00 | 99% |
| | | පලාගල | කුඩාහෙට්ටියාව | 10 | 204,125.00 | 200,000.00 | 99% |

| # | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ගම්මාන | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | මූල්‍ය ප්‍රගතිය (රු) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 8 | රත්නපුර | ඇහැලියගොඩ | කැන්දන්ගමුව පහළගම වසම | 10 | 214,330.00 | 139,930.00 | 100% |
| 9 | බදුල්ල | වැලිමඩ | දඹවින්න හා නාවෙල | 9 | 204,125.00 | 134,726.00 | 95% |
| | | මහියංගණය | දෙහිගොල්ල හා බෙලිගල්ල | 20 | 408,250.00 | 400,000.00 | 95% |
| 10 | කළුතර | අගලවත්ත | රත්මලේ නැගෙනහිර | 10 | 224,535.00 | 169,525.00 | 89% |
| 11 | මහනුවර | පාතදුම්බර | 645 තල්කොටුව | 4 | 86,750.00 | 85,750.00 | 100% |
| 12 | මඩකලපුව | මන්මුනේ බටහිර | කුරුන්තායිමුන්මාරි කාන්විරන්කුඩා මන්මුනේ බටහිර | 20 | 326,600.00 | 320,000.00 | 95% |
| | | පෝරතිවුපත්තු | පෝරතිවුපත්තු | 20 | 408,245.00 | 396,363.75 | 85% |
| | | මන්මුනේ නිරිත | කාත්තන්කුඩි | 5 | 14,290.00 | 14,217.00 | 100% |
| **එකතුව** | | | | **380** | **9,899,970.00** | **9475,200.50** | |






පුහුණු වැඩසටහන සහ උපකරණ බෙදාදීම - තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

### 2.3.4. කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ කිතුල් ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදුන් අතර, දිස්ත්‍රික් මට්ටමින් කිතුල් නිෂ්පාදන අලෙවි සැල් ස්ථාපිත කිරීම, කිතුල් පැණි හකුරු හා ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීම සහ ප්‍රමිතියෙන් යුතු ගුණාත්මක නිෂ්පාදන වෙළෙඳපොළ තුළ ප්‍රචලිත කිරිම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

කිතුල් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- කිතුල් නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන අලෙවිය සඳහා අලෙවි මධ්‍යස්ථාන 2ක් ඉදිකිරීමට අරමුදල් සැපයීම
- රක්ෂිත වනාන්තරවල කිතුල් මල් මැදීම සඳහා වන මැදිහත්වීම්
- නව සුරාබඳු පනත පිළිබඳව කිතුල් කාර්මිකයින් දැනුවත් කිරීම

- කිතුල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සහය ලබා දීම
- කිතුල් කාර්මිකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, භාණ්ඩ උපකරණ ලබා දීම
- කිතුල් කර්මාන්ත ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් සෑදීම

2019 වසරේදී කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දේශීය අරමුදලින් රු.මි. 5ක ප්‍රතිපාදන ලබා දී ඇත. දිස්ත්‍රික්ක 10 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 25ක ප්‍රතිලාභීන් 1,042 දෙනෙකු වෙනුවෙන් සිදුකළ සංවර්ධන කටයුතු පහත දැක්වේ.

***කිතුල් ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය - 2019***

| # | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ගම්මාන | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | මූල්‍ය ප්‍රගතිය (රු.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 1 | කෑගල්ල | වරකාපොළ | මල්මඩුව | 16 | 61,235.00 | 61,050.00 | 100% |
| | | දෙහිඕවිට | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 50 | 796,080.00 | 677,144.00 | 85% |
| | | අරණායක | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 20 | 117,370.00 | 113,400.00 | 100% |
| | | මාවනැල්ල | හෙම්මාතගම | 30 | 224,535.00 | 222,929.05 | 100% |
| | | බුලත්කොහුපිටිය | පැලැම්පිටිය,දේදුගල, උඩුව,අලවතුර, බුලත්කොහුපිටිය | 8 | 56,135.00 | 54,990.00 | 100% |
| 2 | නුවරඑළිය | හඟුරන්කෙත | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 83 | 61,235.00 | 61,235.00 | 100% |
| 3 | ගාල්ල | යක්කලමුල්ල | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 30 | 199,020.00 | 193,750.00 | 95% |
| | | නෙළුව | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 10 | 132,680.00 | 124,038.00 | 91% |
| | | තවලම | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 300 | 61,235.00 | 60,926.25 | 100% |
| | | ඇල්පිටිය | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 20 | 224,535.00 | 219,725.00 | 99% |
| | | නියාගම | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 60 | 102,060.00 | 89,751.95 | 80% |
| 4 | රත්නපුර | අයගම | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 40 | 193,915.00 | 190,000.00 | 98% |
| | | ඇහැළියගොඩ | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 25 | 45,925.00 | 44,469.00 | 100% |
| | | ගොඩකවෙල | තඹලගමුව බටහිර | 20 | 204,125.00 | 199,600.00 | 97% |
| | | රත්නපුර | මාපලාන | 20 | 163,300.00 | 160,000.00 | 98% |
| | | බලංගොඩ | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 50 | 224,535.00 | 220,000.00 | 97% |
| 5 | හම්බන්තොට | කටුවන | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 70 | 163,300.00 | 163,300.00 | 100% |
| 6 | බදුල්ල | ලුණුගල | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 30 | 602,165.00 | 582,496.00 | 78% |
| | | වැලිමඩ | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 10 | 147,990.00 | 59,692.00 | 65% |
| 7 | මාතර | පිටබැද්දර | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 50 | 306,185.00 | 300,000.00 | 89% |
| 8 | පුත්තලම | හලාවත | කරව්ටාගාර | 20 | 219,435.00 | 17,500.00 | 95% |
| 9 | කළුතර | පාලින්දනුවර | ප්‍රා.ලේ කොට්ඨාශය තුළ | 40 | 244,950.00 | 240,000.00 | 97% |
| | | අගලවත්ත | හරන්කහපත | 10 | 102,060.00 | 73,000.00 | 75% |
| | | මතුගම | ගුරුදල | 15 | 90,835.00 | 90,030.00 | 100% |
| 10 | මහනුවර | අකුරණ | දුණුවිල උතුර,දුණුවිල දකුණ,පල්ලේදිගල, උඩදිගල | 15 | 173,505.00 | 170,000.00 | 96% |
| | එකතුව | | | 1042 | 4,918,345.00 | 4,389,026.25 | |

### 2.4. ග්‍රාමීය ආර්ථික අංශය මගින් 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති

ග්‍රාමීය ආර්ථික සංවර්ධන වැඩසටහන යටතේ 2020 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත.

| | |
|---|---|
| කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය | - රු.මි. 5 |
| මැටි ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය | - රු.මි. 10 |
| සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය | - රු.මි. 20 |

මෙම කර්මාන්ත ආශ්‍රිතව ජීවනෝපාය කටයුතුවල යෙදෙන කර්මාන්තකරුවන්, ශිල්පීන් හා ව්‍යවසායකයන් සංවර්ධනය කිරීම සඳහා වන ව්‍යාපෘති යෝජනා අනුව අදාල සංවර්ධන කටයුතු ඉටු කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත 2020 වර්ෂය සඳහා ලැබීමට නියමිත ප්‍රතිපාදන යොමු කර අවශ්‍ය සංවර්ධන කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

### 2.5. 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

#### 2.5.1. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන නවීකරණ කටයුතු

ආර්ථික මධ්‍යස්ථාන නවීකරණ කටයුතු සඳහා 2019 වසරේදී දේශීය අරමුදලින් රු.මි. 10ක ප්‍රතිපාදන ලබා දී ඇත. 2019.12.31 දින වන විට ප්‍රගතිය පහත පරිදිවේ.

| නවීකරණ කාර්යය | ප්‍රතිපාදන (රු.මි.) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|
| **වවුනියාව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය** | | | |
| වවුනියාව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය සඳහා කාර්යාල උපකරණ ලබා ගැනීම | 0.65 | මිලදී ගැනීමේ කටයුතු අවසන් කර ඇත. | 0.65 |
| **තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය** | | | |
| තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධන කිරීම ( ගලී ට්‍රීට්මන්ට් සහ ආරක්ෂක තාප්පය ඉදිකිරීම | 5.5 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. | 5.5 |
| **මඩකලපුව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය** | | | |
| මඩකලපුව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය සඳහා කාර්යාල උපකරණ ලබා ගැනීම | 0.503 | මිලදී ගැනීමේ කටයුතු අවසන් කර ඇත. | 0.503 |
| මඩකලපුව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය සඳහා විදුලිය ලබා ගැනීම | 1.14 | වැඩ කටයුතු අවසන් කර ඇත. | 1.14 |
| **ඇඹිලිපිටිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය** | | | |
| බදු දීමට ඇති කඩ කාමර අලුත්වැඩියා කිරීම | 0.784 | වැඩ කටයුතු අවසන් කර ඇත. | 0.784 |

ග්‍රාමීය ආර්ථික කටයුතු හා පශු සම්පත් සංවර්ධන අංශයෙහි ප්‍රගතිය හා ඉදිරි දැක්මට අදාළව දෙවන පරිච්ඡේදය මගින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය බව සහතික කරමි.

ජේ. එම්. ඒ. ඩග්ලස්
අතිරේක ලේකම් (සංවර්ධන හා සැලසුම්)
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ
ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය
"ගොවිජන මන්දිරය"
අංක. 80/5, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

# 3. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

රු.

| අයවැය 2019 | | සටහන | තතය 2019 | තතය 2018 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | **1** | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | **2** | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | **3** | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | **4** | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | **875,020,413** | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 767,362,472 | - | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 2,400,472 | - | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 16,936,454 | - | ඒසීඒ-5/5(ඒ)/5(බී) |
| - | වෙනත් ලැබීම් | | 88,321,015 | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **875,020,413** | - | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **875,020,413** | - | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| - | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | **5** | 293,409,769 | - | |
| - | අනෙකුත් භාණ්ඩ හා සේවා | **6** | 154,023,770 | - | ඒසීඒ-2(ii) |
| - | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | **7** | 1,285,782 | - | |
| - | පොළී ගෙවීම් | **8** | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | 28,400 | - | |
| 505,950,000.00 | **මුළු පුනරාවර්තන වියදම් (ඇ)** | | **448,747,721** | - | |
| | **මූලධන වියදම්** | | | | |
| - | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | - | - | |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 207,840 | - | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| - | හැකියා වර්ධනය | **14** | 2,111,605 | - | |
| 6,954,600,000.00 | වෙනත් මූලධන වියදම් | **15** | 3,945,703,891 | - | |
| - | **මුළු මූලධන වියදම් (ඉ)** | | **3,948,023,336** | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **25,792,018** | - | |
| | **තැන්පතු ගෙවීම්** | | 2,377,163 | - | ඒසීඒ-4 |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 23,414,855 | - | ඒසීඒ-5/5(ඒ)/5(බී) |
| | **මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)** | | **4,422,563,075** | - | |
| 7,460,550,000.00 | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | **(3,547,542,662)** | - | |

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 605,386,430.00 | - |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 51,841,349.00 | - |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 394,163.00 | - |
| මුළු වත්කම් | | **657,621,942.00** | - |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 30,076,832.00 | - |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 605,386,430.00 | - |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 21,764,517.00 | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 394,163.00 | - |
| මුළු වගකීම් | | **657,621,942.00** | - |

පිටු අංක 06 සිට 39 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 40 සිට 50 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

..........................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර : නිල් බණ්ඩාර හපුහින්න
ලේකම්
දිනය :
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය
අංක. 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

..........................
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර : ප්‍රියන්තා අබේරත්න
අතිරේක ලේකම් (පාලන)
දිනය :
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය
"ගොවිජන මන්දිරය"
අංක. 80/5, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

..........................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය :
පී. රූපකරන්
ප්‍රධාන ගණකාධිකාරි
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

2

## 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | | ඒසීඒ-සී |
|---|---|---|
| **2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | | |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | | |
| | සත්‍ය | |
| | **2019**<br>රු. | **2018**<br>රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 88,321,015 | - |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | 767,362,472 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **855,683,487** | **-** |
| | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 413,570,029 | - |
| සහනාධාර සහ මාරුකිරීම් | 1,285,782 | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 5,000,000 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 63,206,602 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **483,062,413** | **-** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **372,621,074** | **-** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 1,136,466 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **1,136,466** | **-** |
| | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 351,615,779 | - |
| අත්තිකාරම් ගෙවීම් | 21,592,332 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **373,208,111** | **-** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(372,071,645)** | **-** |
| | | |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **549,429** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 2,221,897 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **2,221,897** | **-** |
| | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 2,377,163 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **2,377,163** | **-** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **(155,266)** | **-** |
| | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **394,163** | **-** |
| **නොපියවූ අතුරු අග්‍රිමය** | **(394,163)** | |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | **-** |

## 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

**1. වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2. මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර, සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3. ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර, පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථා වලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

**5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම, දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුමවේ.

**6. මුදල් හා මුදල් සමාන දෑ**

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි වලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

## 3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු.,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 20.02.02.99 | පොළිය - අනෙකුත් | 1,600 | - | 2,060 | - |
| 20.03.99.00 | විකිණුම් හා ගාස්තු | 1,500,000 | - | 87,514 | - |
| 20.02.01.01 | රජයේ ගොඩනැගිලි කුලී - නිල නිවාස | 400 | - | 430 | - |

## 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු.,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 505,950 | 505,950 | 448,747.721 | 89 |
| ප්‍රාග්ධන | 6,954,600 | 6,954,600 | 3,948,023.336 | 57 |

## 3.7. මු.රෙ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු,000

| # | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුදල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1. | ජනාධිපති කාර්යාලය | දියර කිරි නිෂ්පාදනය ඉහළ දැමීම සහ ප්‍රාථමික අධ්‍යාපනය ලබන දරුවන්ගේ පොෂණය ඉහළ නැංවීම | 5,000 | 5,000 | 5,000 | 100 |

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු,000

| වත්කම් කේතය | කේත විස්තරය | **2019.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **2019.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැඟිලි හා ව්‍යුහයන් | - | - | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | - | 605,386 | - | 100 |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

23 DEC

ශීර්ෂය 154 - ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ **2018** දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත **2018** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් **2018** දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන

බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ද මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි අදායම් නොවන ලැබීම් රු.6,848,028 ක් අඩුවෙන් ද, වෙනත් ශුද්ධ ලැබීම් රු.**5,777,530** ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් ආදායමේ ශුද්ධ අඩුවීම රු.1,070,498 ක් විය. | **2018** නොවැම්බර් **21** දිනැති අංක **267/2018** දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ හි **3.1** ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව ගිණුම් ප්‍රකාශ පිළියෙල කරන ලද අතර මේ පිළිබඳව පුහුණුවීමක් හෝ මාර්ගෝපදේශයක් නොලැබුණු හෙයින් අමාත්‍යාංශය විසින් එකතු කළ ආදායම වෙන් වශයෙනුත් වියදම වෙන් වශයෙනුත් ගෙන රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත අංක 02 ට අනුකූල වන ලෙසට ගිණුම් පිළියෙළ කරන ලදී. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි අත්තිකාරම් ගෙවීම් රු.2,031,563 ක් අඩුවෙන් ද, රාජ්‍ය ආදායමින් ආපසු ගෙවීම් රු.1,519,987 ක් වැඩියෙන් ද දක්වා තිබීම හේතුවෙන් වියදම් රු.**511,576** ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට නිවැරදි අග්‍රිම ශේෂය රු.**2,652,258,207** විය යුතු නමුත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි ශේෂය රු.2,652,817,128 ක් ලෙස දැක්වීමෙන් රු.558,921 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයට මුදල් රෙගුලාසි 208 මගින් ලැබුනු ප්‍රතිපාදන රු.909,880 ක් අඩුවෙන් ද, මාසික ගිණුම් සාරාංශ සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව සැසඳීම් කළ පසු අත්තිකාරම් ගිණුමේ ලැබීම් හා ගෙවීම් හි වෙනස පිළිවෙලින් රු.4,690,268 ක් හා රු.398,653 ක් ගැලපීම් නොකර සකස් කිරීම, වැය විෂයය වියදම් හි ඇතුලත් හරස් සටහන් ගෙවීම් ලෙස රු.29,376,105 ද, මුදලෙන් ලද අධිභාර ලෙස රු.769,617 ද හා හරස් සටහන් ලැබීම් ලෙස රු.33,249,060 ද වැරදි ලෙස ගැලපීම් සිදු කර ශූන්‍ය අගයක් ලබාගැනීමට කටයුතු කර තිබුණි. | **2018** නොවැම්බර් **21** දිනැති අංක **267/2018** දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ හි **3.1** ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව ගිණුම් ප්‍රකාශ පිළියෙල කරන ලද අතර මේ පිළිබඳව පුහුණුවීමක් හෝ මාර්ගෝපදේශයක් නොලැබුණු හෙයින් අමාත්‍යාංශය විසින් එකතු කළ ආදායම වෙන් වශයෙනුත් වියදම වෙන් වශයෙනුත් ගෙන රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත අංක 02 ට අනුකූල වන ලෙසට ගිණුම් පිළියෙළ කරන ලදී. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 දෙසැම්බර් 31 වන දිනට ජංගම නොවන වත්කම් වටිනාකම රු.633,057,435 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ආරම්භක ශේෂය රු.1,564,496,082 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.930,438,647 ක් වැඩියෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි. | 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය 2018 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය ලෙස සැලකිය යුතු වීම. | අමාත්‍යාංශය පෙර පැවති අමාත්‍යාංශ 3 කින් ඒකාබද්ධ වී පැවති බැවින් 2017 වසරේදී වත්කම් හඳුනා ගැනීමේ ගැටළු ඇත, 2018 වර්ෂයේදී සියළු වත්කම් හඳුනාගෙන නැවත වරක් තක්සේරු කරන ලද බැවින් වත්කම්වල වටිනාකම වැඩි විය. |

## 1.6.3 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය | නිර්දේශය | අමාත්‍යාංශයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **KJ 3853** අංක දරන වාහනය **2018** සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවලදී අනතුරට පත් වී තිබුණි. ඒ සම්බන්ධව අළුත්වැඩියා වියදම් වටිනාකම හා රු.22,600 ක රක්ෂණ වන්දි ලැබීම් සඳහා තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් නොවීය. තවද, මූල්‍ය ප්‍රකාශන තුළ පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශයේ අලාභය එකතුව රු. 101,650 ක් දක්වා තිබුද, මුදල් රෙගුලාසි ප්‍රකාරව සකස් කළ යුතු අවසන් වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අලාභයට වගකිව යුතු පාර්ශවය හඳුනාගෙන අලාභය අය කර ගත් පසු මු.රෙ. 109 ප්‍රකාරව අලාභය පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශය පිළියෙල කල යුතු විම. | 2018 ඔක්තෝබර් 10 දින අනතුරට ලක්වීම සම්බන්ධයෙන් වාහනයේ රියදුරු කොහුවල පොලිස් ස්ථානය වෙත පැමිණිලි කර රියදුරු විසින් ලබා දුන් ප්‍රකාශයේ පිටපත හා අනතුරු පිළිබඳ පොලිස් වාර්තාව 2018 ඔක්තෝබර් 12 දින ඉල්ලුම් කර තිබුනද, මෙතෙක් එම ලේඛන නිකුත් කර නැත. අදාල ලේඛන ලබා ගෙන එම පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කිරීමට සටහන් කර ගෙන ඇත |
| (ආ) | **2018** මාර්තු මාසයේදී අනතුරට පත් **CAA -0024** අංක දරන වාහනය අළුත්වැඩියා කිරීම සඳහා රු.**105,153** හා රු. **277,321** ක් ලෙස එකතුව රු.382,474 ක් වැය වී තිබුණි. එසේ වුවද, රු.**277,321** ක මුදල ගරාජය වෙත ගෙවූ බවට සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | රජයේ මුදල් සම්බන්ධ සියලුම ලියවිලි හා ලිපි ගොනු යාවත්කාලින කර පවත්වා ගත යුතු වීම. | 2018 මාර්තු 08 දින අංක CAA-0024 දරණ වාහනය අනතුරට ලක් වූ අතර එමගින් වාහනයට සිදු වූ හානිය අළුත්වැඩියා කරන ලදී. අමතර කොටස් නොතිබීම නිසා අළුත්වැඩියාව අවස්ථා 02 ක දී සිදු කල අතර පළමු අළුත්වැඩියාවට අදාල වියදම් රු.277,321.00කි. මෙම ගෙවීමට අදාල තොරතුරු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් ඉල්ලා ඇත. එම තොරතුරු ලද වහාම ඉදිරිපත් කරමි. |

### 1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශයෙ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට 2002, 2015 හා 2017 වර්ෂවල සේවය අතහැර ගිය නිලධාරීන් 03 දෙනෙකු ගෙන් අයවිය යුතු එකතුව රු.244,924 ක් අය කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ xxiv ජේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව කටයුතු කර ණය අයකර ගැනීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වීම. | ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

### 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) <u>ස්ථාවර වත්කම් ලේඛනය</u> | | |
| ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටය අදාළ වන පරිදි ස්ථාවර වත්කම් ලේඛනය විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා ගත යුතු වීම. | භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 අනුව ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර ඇති අතර පෙර පැවති අමාත්‍යාංශ වලින් පැවරුන වාහන වලට අදාළ පොත් හා විස්තර නිසියාකාරව මෙම අංශයට ලැබී නොමැති බැවින් සම්පූර්ණ තොරතුරු ඇතුලත් කිරීමට නොහැකි වී ඇත. මෙම අංශයට මිලදී ගත් ඡායා පිටපත් යන්ත්‍ර වල විස්තරද යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ පිටුවල සටහන් කර ඇත. |

(ආ) ඇප ලේඛනය

| | | |
|---|---|---|
| ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් වෙනුවෙන් ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාර ඇප ලේඛනයක් සකස් කර ඇත. ඇප තැබූ නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් කර ඇප තැබීමට නියමිත අනෙකුත් නිලධාරීන් ඇප තැබීමට අදාළ කටයුතු කරමින් පවතින බවද දන්වා සිටිමි. |

(ඇ) හානි පිළිබඳ ලේඛනය

| | | |
|---|---|---|
| හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය සකස් කර ඇති අතර වාර්තා වී ඇති රථවාහන හානි එයට ඇතුලත් කර ඇත. සතුන් ආනයනයෙන් හා වෙනත් හානි වලින් රජයට සිදුවූ පාඩු වාර්තා වී නොමැති බැවින් හානි පාඩු ලේඛනයට එය ඇතුළත් කර නොමැත. |

(ඇ) අත්තිකාරම් ලේඛනය

| | | |
|---|---|---|
| නිලධාරින්ගේ අත්තිකාරම් නිකුත් කිරීමේදී මුදල් ලබා ගත් නිලධාරියාගේ තනතුර, වවුචර් අංකය සහ අත්තිකාරම් පියවීමේදී වවුචර් අංකය ද අත්තිකාරම් ලේඛනයේ සටහන් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 488 (2) ප්‍රකාරව අත්තිකාරම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. | අත්තිකාරම් ලබා ගැනීමට ඉදිරිපත් කරන වවුචර අනුව නිලධාරින්ගේ තනතුර ආදී තොරතුරු අත්තිකාරම් ලේඛනයට ඇතුලත් කිරීමට විෂයභාර නිලධාරීට උපදෙස් දෙන ලදී. මුදල් ලබාගන්නා අවස්ථාවේදී පොදු 35 වවුචරයේ අත්සන් තබනු ලැබේ. වවුචර් අංකය මුදල් පොතේ හා ගෙවීම් වවුචරයේ සඳහන්ව ඇත. |

### 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ දැක්වීම |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 104 (3) | ප්‍රාරම්භක වාර්තාව දින 7ක් ඇතුලත ඉදිරිපත් කළ යුතු වුවත්, විගණිත දිනය වන විට වාහන 02 කට අදාළව අනතුරු සිදුවී පිළිවෙලින් දින 353 ක් හා දින 120 ක් ගතවී ඇතත් ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව 104(3) ප්‍රකාරව හානි සම්බන්ධයෙන් දින 7ක් ඇතුලත ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කළ යුතු වීම. | අමාත්‍යතුමාට හා අමාත්‍ය කාර්ය මණ්ඩලයට අනුයුක්ත මෙම වාහන අනතුරු දෙකට අදාළව රියදුරන්ගෙන් ප්‍රකාශ ලබා ගැනීමට නොහැකිවී ඇත. ඒකපාර්ශවීය පරීක්ෂණයක් පවත්වා වාර්තා කඩිනමින් ඉදිරිපත් කරමි. |
| (ආ) | මුදල් රෙගුලාසි 104 (4) | පූර්ණ වර්තාවක් මාස 3 ක් ඇතුලත ඉදිරිපත් කළ යුතු වුවත්, විගණන දින වන විට අනතුරු සිදුවීම මාස 5 ක සිට මාස 50 ක් දක්වා කාල පරාසයක් ගතවී ඇති වාහන 6 ක් සම්බන්ධව එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පූර්ණ වර්තාවක් මාස 3 ක් ඇතුලත ඉදිරිපත් කළ යුතු වීම. | අදාළ පරීක්ෂණ අවසන් කර කඩිනමින් වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | දඹුල්ල කළමනාකරණ භාර ඔප්පුවේ 07 වන වගන්තියේ (අ) උප | භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය මත භාරයේ සියලුම අතිරික්ත ඉතුරුම් අදාළ ආයෝජනයන්හි යෙදවිය යුතු | පවත්නා නීතිරීති පිළිබඳව නිලධාරීන්ගේ දැඩි අවධානය | කළමනාකරණ භාර ස්ථාපනකරු විසින් භාර අරමුදල්වල අතිරික්ත මුදල් වැඩිම පොළී අනුපාතිකයක් ලබා දෙන රාජ්‍ය |

| | | | |
|---|---|---|---|
| වගන්තියේ (i) වන ඡේදය | බවත්, නොඑසේ නම් රජයේ ආයෝජන මාර්ග වන භාණ්ඩාගාර බිල්පත් හෝ සුරැකුම්පත්වල පමණක් ආයෝජනය කළ යුතු බව දක්වා තිබුණද, ඊට අනුකූලව නොවී අනුමැතියකින් තොරව කළමනාකරණ භාරය විසින් රු.71,572,186 ක අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | යොමු කළ යුතු විය. | බැංකුවලද ආයෝජනය කිරීමට උපදෙස් නිකුත් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 වියදම් කළමනාකරණය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 සිට 2020 දක්වා වර්ෂ වලදී කිරි ගවයින් 15,000 ක් ආනයනය සඳහා ගෙවිය යුතු ඇමරිකන් ඩොලර් 55,465,541ක මුළු මුදලින් සියයට 20 ක් එනම් (ඇමරිකන් ඩොලර් 11,093,108) රු.1,749,672,697 ක් අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත්කරු වෙත 2018 වර්ෂයේදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය ණයක් ලෙස විදේශීය බැංකුවක් හරහා ණය පදනමට ලබා ගෙන ගෙවා තිබුණි. නමුත් මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මේ සඳහා 2018 වර්ෂයට ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව ප්‍රතිපාදන ඇත්නම් විනා වැඩක්, සේවාවක් හෝ සැපයුමක් සඳහා වියදමකට හෝ බැඳීමකට නොබැඳිය යුතු වීම | කිරි ගවයින් 20,000 ක් ආනයනය කිරීමේ ව්‍යාපෘතිය, ප්‍රථම අදියරෙහි සාර්ථකත්වය මත දෙවන අදියර ආරම්භ කිරීමට තීරණය කර තිබූ අතර ව්‍යාපෘතියේ ප්‍රථම අදියර යටතේ 2017 වර්ෂයේදී ආනයනය කල දෙනුන් 5,000ක් සම්බන්ධව 2018.මාර්තු 22 දින ඉදිරිපත් කල විශේෂඥ කමිටුවෙහි වාර්තාව අනුව දෙවන අදියර දියත් කිරීම සුදුසු බව නිර්දේශ කරන ලද අතර, එම නිර්දේශයන් මුදල් අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ එකඟතාවයද මත භාණ්ඩාගාරය විසින් ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මක |

| | | | |
|---|---|---|---|
| | | | කිරීමට අදාළ ඇ.ඩො.11,093,108 ක අත්තිකාරම් මුදල් ගිවිසුම් ප්‍රකාරව නිදහස් කිරීම සිදු කොට ඇත. නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් මත 2019 වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා ඇත. |
| (ආ) | පුනරාවර්තන වියදම් විෂයයන් 24 ක් සඳහා වෙන්කල රු.මිලියන 1,093.34 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 680.59 ක් වැය කර එනම්, සියයට 6 ක සිට සියයට 86 ක් දක්වා වූ පරාසයක් තුළ ඉතිරිය රු.මිලියන 412.75 ක් විය. තවද, පුනරාවර්තන විෂයයන් 2 කට වෙන්කර තිබූ රු.මිලියන 0.72 ක මුළු ප්‍රතිපාදනයම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | 2018 වසර මැද ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට එකතුවීම නිසා ගරු අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය මෙම අංශයෙන් ඉවත්වීම හේතුවෙන් ඊට අදාල පුනරාවර්තන වියදම් ඉතිරි වී ඇත. |
| (ඇ) | ප්‍රාග්ධන වියදම් යටතේ වැය විෂයන් 16 ක් සඳහා වෙන්කල රු.මිලියන 2,989.62 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,434.27 ක් වැය කර සියයට 6 ක සිට සියයට 94 ක් දක්වා වූ පරාසයක් තුළ රු.මිලියන 554.34 ක ඉතිරියක් සහ ප්‍රාග්ධන විෂයයන් 6 කට වෙන්කර තිබූ එකතුව රු.මිලියන 6.5 ක මුළු ප්‍රතිපාදනයම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | -එම- | ගරු අමාත්‍යවරයා වසර මැද දී මෙම අංශයෙන් ඉවත්වූ නිසා ඒ වෙනුවෙන් වෙන් කර තිබූ ප්‍රාග්ධන ප්‍රතිපාදන ඉතිරිවීමත් යන්ත්‍රෝපකරණ හා වාහන වල (විශාල) ප්‍රාග්ධන අලුත්වැඩියාවන් ගෙවීමට සිදු නොවීමත්, කාර්ය මණ්ඩල පුහුණු සඳහා නිලධාරින් ඉදිරිපත් නොවීමත් ප්‍රාග්ධන ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු විය . |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරිය රු. 276,548 ක් ඉක්මවා පෞද්ගලික හා රාජ්‍ය ආයතන වෙත ගෙවිය යුතු රු. 1,283,259 ක බැරකම් සඳහා එකඟවී තිබීමෙන් ප්‍රතිපාදන ඉක්මවා රු. 1,006,711 ක බැදීම් ඇති කරගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට බැදීම වැළැක්වීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වීම. | බැරකම්ව අදාළ 1301,1402,1403,1409 යන වැය විෂයන්වල ප්‍රමාණවත් ප්‍රතිපාදන 2018 කෙටුම්පත් ඇස්තමේන්තුවලට ඇතුළත් කලද ඇස්තමේන්තු අනුමත වීමේදී ප්‍රතිපාදන අඩුවෙන් ලැබී තිබුණ නිසා මෙම බැරකම් ඇති වූ බව දන්වා සිටිමි. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ක්‍රියාකාරී සැලැස්ම තුළ සෑම වැඩසටහනක් සඳහාම ඉලක්කගත කාල සීමාව ලෙස 2018 ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 ලෙස දක්වා ඇති අතර එක් එක් ක්‍රියාකාරකම ආරම්භ කිරීමට සැලසුම් කල නිශ්චිත කාල වකවානු දක්වා නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වීම. | ප්‍රතිපාදන අවශ්‍ය පරිදි නියමිත කාලයට නිදහස් කර ගැනීමේ අපහසුතාවයන් නිසා එක් එක් වැඩසටහන යටතේ ඇති ක්‍රියාකාරකම් ප්‍රමුඛතා ගත කොට ක්‍රියාත්මක කිරීමට සිදුවී ඇත. එබැවින් එක් එක් ක්‍රියාකාරකම සඳහා නිශ්චිත කාලසීමාවන් සැලැස්ම තුළ අන්තර්ගත කර නැත. |

| | | |
|---|---|---|
| (ආ) ක්‍රියාකාරී සැලැස්ම තුළ එක් එක් වැඩසටහන යටතේ වූ ක්‍රියාකාරකම් සඳහා වෙන් කළ ප්‍රතිපාදන ඇතුළත් කර තිබුණද, ප්‍රගති වාර්තා තුළ වැඩසටහන සඳහා දැරූ මුළු වියදම පමණක් දක්වා තිබුණි. එම නිසා එක් එක් ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රගතිය මිනුම් කළ නොහැකි බව නිරීක්ෂණය විය. | එක් එක් වැඩසටහන යටතේ වූ ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ප්‍රගතිය මිනුම් කළ හැකි පරිදි හා සන්සන්දනය කල හැකි පරිදි ප්‍රගති වාර්තා හා ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කළ යුතු වීම. | ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රගතිය මිනුම් කළ හැකි පරිදි ඉදිරියේදී ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි. |
| (ඇ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා රු.මිලියන 400 ක ප්‍රතිපාදන වෙන් කර ඇති නමුත්, ඒ යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකරකම්, ඉලක්ක නිමවුම හා මිනුම් ඒකක ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොතිබුණි. එබැවින් ප්‍රගති වාර්තාවේ දක්වා ඇති සත්‍ය නිමවුම නිවැරදි බව තහවුරු කර ගත නොහැකි විය. | -එම- | ග්‍රාමීය යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සහ නිමැවුම් පිළිබඳ අවසන් නිගමනයන්ට එළඹීම පාලනය කළ නොහැකි තත්වයන් මත රඳාපවතියි. එබැවින් මෙවන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් පසුව එහි සත්‍ය නිමැවුම පිළිබඳව ප්‍රගති වාර්තාවේ දක්වා ඇති වුවද ක්‍රියාකාරී සැලසුම තුළ අපේක්ෂිත ක්‍රියාකාරකම්, ඉලක්ක නිමැවුම් හා මිණුම් ඒකක ඉදිරිපත් කිරීමේ දුෂ්කරතාවයන් පැන නැඟුණි. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය විසින් 2017 වර්ෂයට අදාළව පිළියෙල කල ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.මිලියන 39.5 ක් වටිනා ව්‍යාපෘති 05 ක් අනුමත කර තිබුණද, එම වර්ෂය අවසාන වන විට | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | මේ වන විට පිටුපස රථගාල සකස් කිරීම හා අපහරණ ටැංකිය සකස් කිරීමේ කටයුතු අවසන් කර ඇත. ආරක්ෂක කැමරා සවි කිරීම, නව වැසිකිළි පද්ධතියක් ඉදි කිරීම, රැස්වීම් ශාලාවේ පඩිපෙළ ඉදි කිරීමේ කටයුතු මෙම වර්ෂය තුළ සිදු කිරීමට නියමිතය. |

එකඳු ව්‍යාපෘතියක් හෝ ආරම්භ කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3.3 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කොළඹ, අම්පාර හා මහනුවර දිස්ත්‍රික්කවල පිහිටි ආර්ථික මධ්‍යස්ථාන 08 ක් පරීක්ෂාවේදී, ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර මධ්‍යස්ථානය ඉදිකරන ස්ථානය නිසිපරිදි හඳුනා නොගැනීම සහ ඇගයීම් නිර්ණායක සකස් කර ඊට අනුකූලව සුදුසු අයදුම්කරුවන් විනිවිදභාවයෙන් යුතුව තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් මධ්‍යස්ථාන 06 ක් අරමුණට පටහැනිව ක්‍රියාත්මක වන බවත්, තවත් මධ්‍යස්ථානවල වැඩි කඩකාමර සංඛ්‍යාවක් වසා දමා ඇති බවත් නිරීක්ෂණය විය. | විශේෂ ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කිරීමට අරමුණු වූ ගොවීන්ගේ කෘෂි නිෂ්පාදන සෘජුව අලෙවිකර ගැනීම තරඟකාරී මිල නිෂ්පාදකයින් සඳහා ලබා දීමත්, පාරිභෝගිකයින් සඳහා සාධාරණ මිලක් ලබාදීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගෙන ආර්ථික මධ්‍යස්ථානයන් සක්‍රීයව පවත්වාගෙන යාමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම කළ යුතු වීම. | අමාත්‍යාංශය සහ කළමනාකරණ භාරයන් සමඟ එක්ව ආර්ථික මධ්‍යස්ථාන සක්‍රීයව පවත්වාගෙන යාමට අවශ්‍ය පියවරයන් මේ වන විට ගෙන ඇත. |

## 3.4 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අම්පාර විශේෂ ආර්ථික මධ්‍යස්ථානයේ කඩ 15 කින් අගෝස්තු මාසය දක්වා මාස 3 ක සිට මාස 8 ක් දක්වා කඩකුලී රු.245,500 ක මුදලක් හිඟව පැවතිණි. | කඩ කාමරවලින් නියමිත දිනට කුලී විධිමත් ගිවිසුම්වල එළඹීම් හා නියමිත දින කුලී අයකර ගැනීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කර එය නිරන්තරයෙන් සිදුවනවාද යන්න අධීක්ෂණය කළ යුතු වීම. | අය විය යුතුව තිබූ හිඟ පවරා ගත යුතුව තිබූ ව්‍යාපාර පරිශ්‍රද පවරා ගෙන ඇත. දැනට හිස්ව පවතින ව්‍යාපාර පරිශ්‍ර ද අයදුම්පත් කැඳවා ලබා දීමට කටයුතු කරමින් පවතී. |

## 3.5 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ සමුපකාර තොග වෙළඳ සංස්ථාව මඟින් රු.මිලියන 42.75 ක් වැය කර ඉදිකර තිබූ වර්ග අඩි 14,536 ක් වූ දෙමහල් බැංකු සංකීර්ණ ගොඩනැගිල්ල වර්ෂ 06 කට ආසන්න කාලයක සිට භාර ගැනීම හෝ භාරදීමක් සිදු නොවී අදාළ කාර්යය සඳහා යොදා නොගෙන නිශ්කාර්යව තිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | 1997 සැප්තැම්බර් 30 දිනැති අංක 353 දරන, 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන හා 2003 ජනවාරි 03 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව සහ මුදල් රෙගුලාසි 771 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම ගොඩනැගිල්ල විධිමත් පරිදි භාර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | 2004 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු දියර කිරි ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ කිරි අලෙවි සැල් 1,250 පිහිටුවීමට සැලසුම් කර තිබුණි. 2013 වර්ෂය වන විට ඉන් අලෙවි සැල් 685 ක් පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ අමාත්‍යාංශය විසින් ආරම්භ කර තිබුණි. සක්‍යතා අධ්‍යයනයකින් තොරව ආරම්භ කිරීම හේතුවෙන් මෙම අලෙවි සැල් 147 ක් පමණක් 2018 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාත්මක තත්වයේ පැවතුණි. | කිරි නිෂ්පාදනය වැඩි කිරීමට විශාල වැයක් දැරූ නමුත්, දියර කිරි පරිභෝජනය වැඩි කිරීමට අවශ්‍ය මෙම අලෙවිසැල් වැසීයාම අවම කිරීම සඳහා අමාත්‍යාංශයේ ඍජු අධීක්ෂණයක් සිදුකළ යුතුවීම. | දියර කිරි පරිභෝජනය වැඩි කිරීම සඳහා ආරම්භ කළ කිරි අලෙවි සැල් වල මුලදී අලෙවිකිරීම සඳහා අවසර දී තිබුනේ දියර කිරි පමණක් වන අතර කිරි අලෙවියෙන් පමණක් ඒවා නඩත්තු කිරීම අපහසු විය. අනෙකුත් ග්‍රොසරි අයිතමයන් ද අලෙවි කිරීමට අවසර දී අලෙවි සැල් දිගටම පවත්වා ගෙන යාමට අවශ්‍ය පසුබිම සකසන ලදි. |

## 3.6 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වෙළෙඳපොල මිල ස්ථායිකරණය ඇති කිරීමට මෙන්ම පසු අස්වනු හානිය අවම කිරීම සඳහා පෞද්ගලික අංශය මගින් කළමනාකරනය කරනු ලබන ශීතාගාර 5ක් ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේදී රු.මිලියන 2,000 ක් හා 2017 වර්ෂයේ රු.මිලියන 500 ක් වශයෙන් ප්‍රතිපාදන වෙන්කර තිබුණි. 2016 වර්ෂයේදී කිසිදු මුදලක් වැය නොකල අතර 2017 වර්ෂය තුල රු.මිලියන 53.4 ක් වැය කර ව්‍යාපෘතියේ මූලික කාර්යයන් ඉටු කළද, නිසි පරිදි ශාක්‍යතා අධ්‍යයනයක් නොකිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් ඉඩම් නොමැති වීම හේතුවෙන් 2019 අප්‍රේල් මාසය දක්වාම එම ව්‍යාපෘතිය නැවත ආරම්භ කර නොතිබුණි. | පිරිවැය අධික ව්‍යාපෘති තාත්වික හා නිවැරදි තොරතුරු මගින් විශේෂඥ ඥාණය යොදවා නිවැරදි සක්‍යතා අධ්‍යයන වාර්තා සැකසීමෙන් අනතුරුව හා නිසි පසුවිපරමකින් යුතු බැවින් ප්‍රතිපාදනවලින් උපරිම ඵලදාවක් ලැබෙන සේ යෙදවීමට අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම යෙදීය යුතු වීම. | එකඟ වෙමි. |

## 3.7 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 පෙබරවාරි 24 වන දින සිට වසර 03 ක් සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන විශිෂ්ඨත්ව පුහුණු ප්‍රවේශය සඳහා වූ හවුල්කාරිත්ව එකඟතා ගිවිසුමකට ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් හා නවසීලන්තයේ මහ කොමසාරිස්වරයා විසින් නවසීලන්ත ඩොලර් මිලියන 2.5 ක අරමුදලක් ඇති කිරීම සඳහා අත්සන් කෙරිණි. එම විදේශාධාර ගනුදෙනු විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් මගින් කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 හි 2 ඡේදයට අනුව විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් මත විදේශාධාර ගණුදෙනු ගිණුම් තැබීම් කිරීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කළ යුතු වේ. | අදාළ නොවේ. |

## 3.8 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ ලියාපදිංචි හිමිකම සහිත එක් වාහනයක් හා ලියාපදිංචි හිමිකම් නොමැති වාහන 5 ක් ද ඇතුළුව වටිනාකම රු.මිලියන 16.3 ක් වූ වාහන 06 ක් 2015 ,2016 හා 2018 වර්ෂවලදී ධාවනයෙන් ඉවත් කර නිෂ්කාර්යයව පැවතුණි. | 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන හා 2003 ජනවාරි 03 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව සහ මුදල් රෙගුලාසි 771 ප්‍රකාරව නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | අමාත්‍යාංශය යටත් තිබෙන වාහන 06ක් ධාවනයෙන් ඉවත් කර තිබෙන අතර එක් එක් වාහනය සම්බන්ධව විවිධ හේතු මත ඉදිරි කටයුතු කිරීම ප්‍රමාද වී ඇත. |

## 3.9 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් භාවිතා කරන ලද අංක KA-6702 දරන වාහනය 2012 නොවැම්බර් 06 දින රියදුරුගේ අපරික්ෂාකාරී ධාවනය නිසා සිදු වූ වාහන අනතුරකින් පසුව අළුත්වැඩියා කිරීමට රු.736,625 ක් වැය වී තිබුණු අතර රක්ෂණ වන්දි ලෙස ලැබී තිබුණේ රු.608,420 ක් පමණි. ඒ අනුව සිදුවූ රු. 128,205 ක අලාභයෙන් ප්‍රතිශතයක් පමණක් අයකර ගැනීමට 2018 වර්ෂයේදී තීරණය කර තිබුණද, අයකර ගත යුතු ප්‍රතිශත කොපමණද | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව වාර්තාව සකස් කර අනතුරෙන් වූ හානියට වගකිවයුතු පාර්ශවයෙන් අලාභ හානි අයකරගැනීමට කටයුතු කළ යුතු වීම. | මු.රෙ.104 ට අනුව සිදුකළ පරීක්ෂණයේ නිර්දේශය පරිදි අලාභය රියදුරුගෙන් අය කිරීමට කටයුතු ආරම්භ කර රු.4,000.00 ක් පමණක් අය කර ගෙන ඇත. 2014.12.01 දින සිට රියදුරුගේ සේවය අවසන් කර තිබූ බැවින් අලාභය ඉන් පසුව අය කර ගෙන නැත. ඉතිරි මුදල |

| | | | |
|---|---|---|---|
| | යන්න තීරණය කර නොතිබුණි. 2014 වර්ෂයේදී රියදුරු සේවයෙන් ඉවත් වීමේදී රු.4,000 ක් පමණක් අයකර ගෙක ඇතත් ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | රියදුරුගේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල වෙතින් අය කර ගැනීමට තීරණය කළද, ආකෘති පත්‍රය රියදුරු සම්පූර්ණ කර ඉදිරිපත් කර නොමැත. මේ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවධානය යොමු කර ඇත. |
| (ආ) | 2014 වර්ෂයේදී අනතුරට පත්වූ අංක **KA 6702** වාහනයේ අළුත්වැඩියා වියදම රු.2,123,468 ක් සම්බන්ධයෙන් ලැබුණු රු.200,443 ක වට්ටම අඩු නොකර මුළු වටිනාකමට මූල්‍ය ප්‍රකාශනවල පොත්වලින් කපාහැරීම් ප්‍රකාශයේ අලාභයේ වටිනාකම ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි අලාභ වටිනාකම දැක්විය යුතු වීම. | අංක **KA- 6702** දරණ වාහනය අනතුරකට ලක් වී ඇත. එහි අලුත්වැඩියා වියදම රු.**2,123,468.** කි. රු.**200,443.50** ක වට්ටමක් ලබා දී ඇත. මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 3.10 කිරි ගව ආනයන ව්‍යාපෘතිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.10.1 නිසි අධ්‍යයනයකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී කිරි නිෂ්පාදනය වැඩි කිරීමට 2006 වර්ෂයේ සකස් කර ඇති ජාතික ප්‍රතිපත්තිය හා 2007 ජූනි 20 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව දේශීය කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කඩිනමින් ක්‍රියාවට නැංවිය යුතු වැදගත් යෝජනා හතරක් අතරින් ජීව සතුන් ආනයනය කිරීම සඳහා පමණක් අවධානය යොමු කර තිබුණි. එම ආනයනයේදී සර්ම කලාපීය දේශගුණයට | රටේ පවතින දේශගුණයට ඔරොත්තු දෙන, පරිසරයට ගැලපෙන හා රටේ සුලබ ආහාර වලින් පෝෂණය කල හැකි කිරිගව වර්ග හඳුනාගෙන රජයේ ප්‍රතිපාදනවලින් වැඩි ඵලදාවක් ලැබෙන සතුන් ආනයනයට සුදුසු ප්‍රතිපත්තියක් සකස් කිරීමට අවධානය යොමුකළ යුතු | තොරතුරු නිරවද්‍ය නොවේ. එවන් රටවලින් කිරි ගවයින් ආනයනය කිරීම ඉතා අපහසුකාරී වන අතර රෝග සම්බන්ධයෙන් මීට වඩා දැඩි අවධානමක් ඇත |

| | | | |
|---|---|---|---|
| | උචිතවන පරිදි හා රටේ පවතින සම්පත්වලින් ගවයින් පෝෂණය කිරීමට , ලෙඩ රෝගවලින් ආරක්ෂා කළ හැකි පරිදි හා අවම පිරිවැයකින් නඩත්තු කළ හැකි සතුන් වර්ග හඳුනාගෙන ආනයනය කිරීම සඳහා ආනයන ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. | වීම. | |
| (ආ) | 2012 වර්ෂයේ සිට කිරි ගවයින් ආනයනය කර ඇති නමුත් ඉදිරි කටයුතු සඳහා එම සතුන් සම්බන්ධව දත්ත පද්ධතියක් සකස් කොට නිසි අධීක්ෂණයක් අමාත්‍යාංශය විසින් සිදුකොට නොතිබුණි. | දත්ත පද්ධතියක් සකස් කොට නිසි අධීක්ෂණය කල යුතු වීම. | ව්‍යාපෘතියේ අදාළ සතුන් සඳහා දත්ත පද්ධතියක් සකස් කර ඇත. |
| (ඇ) | 2017 වර්ෂයේ කිරි ගවයින් 20,000 ක් ආනයනය කිරීම සඳහා 2015 වර්ෂයේ සිදු කර ඇති ශක්‍යතා වාර්තාවේ ඇගයීම අනුව ආහාර වියදම කිරි ආදායමින් සියයට 57.38 ප්‍රතිශතයක් ලෙස ගණනය කර තිබුණි. එසේ වුවද පශු සම්පත් මණ්ඩලයේ ගොවිපළවල තත්‍ය ආහාර වියදම කිරි ආදායමෙන් සියයට **69** ක සිට සියයට **89.71** ක පරාසයක් ප්‍රතිශතයක් ගෙන තිබුණි. | විශේෂයෙන් මෙවැනි පිරිවැය අධික ව්‍යාපෘති සඳහා තාත්වික හා නිවැරදි තොරතුරු මගින් විශේෂඥ ඥාණය යොදවා නිවැරදි හා ස්වාධීන සක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කර සීමිත සම්පතක් වන රාජයේ ප්‍රතිපාදන වලින් උපරිම ඵලදාව ලබාගැනීමට කටයුතු කල යුතු වීම. | නිරවද්‍ය නොවේ. |
| (ඇ) | උක්ත ශක්‍යතා වාර්තාවට අනුව පළමු වසරේ ක්ෂීරණයකදී ලබාගත හැකි දෛනික නිෂ්පාදනය දිනකට ලීටර් 18 ක් හා දෙවන වසරේ දිනකට ලීටර් 19.5 ක් විය යුතු යැයි දක්වා තිබුණි. එසේ වුවද, පශු සම්පත් මණ්ඩලය ආනයනය කළ සතුන්ගෙන් පළමු වසරේ දිනකට උපරිම කිරි ලීටර් **15** ක් හා දෙවන වසරේ දිනකට ලීටර් **16** ක් ලැබී තිබුණි. | -එම - | මෙම ව්‍යාපෘතිය සම්බන්ධ ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් 2017 වර්ෂයේදී ඉදිරිපත් වී නොමැති අතර, ඒ පිළිබඳව ඉදිරිපත් කොට ඇති කරුණු පැහැදිළි නොමැති බැවින් නිශ්චිත පිළිතුරු ලබාදීම සඳහා පැහැදිළිව විමසන්නේ නම් මැනවි. |
| (ඉ) | ශක්‍යතා වාර්තාව අනුව කිරිගවයකුගේ ගැබ් ගැනීමේ ප්‍රතිශතය සෑම වර්ෂයකම සියයට 80 ක් බව පෙන්වා ඇත. නමුත් කෘත්‍රිම සිංචනය මඟින් දිවයින තුළ මේ වන විට සිංචන | - එම - | තොරතුරු නිරවද්‍ය නොවේ. |

| | | | |
|---|---|---|---|
| | සඵලතාව සියයට 25ක සිට සියයට 30 ක් අතර පරාසයක් විය. | | |
| (ඊ) | 2007 වර්ෂයේ ටෙන්ඩර් කැඳවීම මගින් අමාත්‍යාංශය යටතේ තිබූ පශු සම්පත් මණ්ඩලයට කිරි ගව ආනයනය සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරුටම නැවත ටෙන්ඩර් කැඳවීම් නොකර ඩොලර් මිලියන 73.95 කට කිරිගවයින් 20,000 ක් ආනයනයට අමාත්‍යාංශය විසින් 2014 ඔක්තෝබර් 14 දින ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුම 2016 නොවැම්බර් මස සංශෝධනය කර අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීමට නැවත ගිවිසුම් ගතවී පළමු ප්‍රසම්පාදනය අවසන් වී වසර 10 කට පසු 2017 සිට 2020 දක්වා ගවයින් 20,000 ක් ආනයනයට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධි විධාන ප්‍රකාරව ටෙන්ඩර් කැඳවීම මගින් වැඩි ප්‍රතිලාභයක් ලැබෙන කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම කළ යුතු වීම. | ව්‍යාපෘතිය සැළසුම් කරන ලද්දේ එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වන අතර අදාළ විෂයානුබද්ධ අමාත්‍යාංශය වන පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මගින් විධිමත් ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් ක්‍රියාවලියක් මත තොරා ගන්නා ලද සැපයුම්කරු වෙතම එම ටෙන්ඩරය ලබා දුන් අතර ඒ සඳහා අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. |

### 3.10.2 ව්‍යාපෘතිය අසාර්ථක වීම නිසා අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා ගැනීම

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

2017 වර්ෂයේ කිරිගව ආනයන ව්‍යාපෘතිය යටතේ පළමු අදියරේදී කිරිගවයන් 1994 ක් හා දෙවන අදියරේදී 3204 ක් ආනයනය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙවන අදියරේ ආනයනය කළ සතුන් 3,024 න් නියැදි වශයෙන් තෝරාගත් සතුන් 858ක් ඇති කරන කිරි ගොවීන් 12 දෙනෙකුගෙන් ලබාගත් වාර්තා අනුව ඔවුන් මාසිකව රු.25,240 සිට රු.මිලියන 5.2 ක් දක්වා පරාසයක් තුල අලාභයන් ලබා තිබුණි. | පශු සම්පත් ක්ෂේත්‍රයේ විෂය දැනුම සහිත විශේෂඥ ඥාණය යොදවා නිවැරදි සක්‍යතා අධ්‍යයන වාර්තා සැකසීමෙන් අනතුරුව රටට ඵලදායී වන ලෙස ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතු වීම. | තොරතුරු පිළිගත නොහැක. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පලමුවර ආනයනය කල කිරි ගවයන් 1994 න් තෝරාගත් සතුන් 902ක නියැදියෙන් 2019 පෙබරවාරි 28 දිනට මව් සතුන් 656 ක් පමණක් ජීවත්ව සිටින අතර, එම සතුන්ගෙන් පැටවු ලැබී දැනට ගොවිපල තුල ජීවත්ව සිටින්නේ සතුන් 190 ක් පමණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර අදාල විෂයය පිලිබද දැනුම ඇති පුද්ගලයින් යොදා සක්‍යතා අධ්‍යයනයන් සිදු සැල යුතු වීමත් ඊට අමතරව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී හා නිසි අධීක්ෂණයන් සිදු කොට ගොවීන් මුහුණපාන ගැටළු හා ප්‍රශ්න පිළිබඳව අඛණ්ඩව නිලධාරීන්ගේ අධීක්ෂණයට හා ඇගයීමට යොමු කිරීම හා අවශ්‍ය තොරතුරු නිසි පරිදි ලේඛනගත කර අවශ්‍ය සෑම තොරතුරකටම අදාල දත්ත ගබඩා කර දත්ත පද්ධතියක් පවත්වා ගත යුතු වීම හා ගොවීන්ට අවශ්‍ය උපදෙස් නිසි පරිදි නිසි කලට ලබාදීම කළ යුතු වීම. | |
| (ඇ) | දෙවන වර ආනයනය කළ කිරි ගවයන් **3024** න් 858 ක නියැදියෙන් පළමු වර පැටවු 803 ක් බිහිකර තිබු අතර එයින් පිරිමි සතුන් 424 ක් එනම් සියයට 53 ක ප්‍රතිශතයක් විය. තවද, බිහි කළ පැටවුන් 803 න් පැටවු 361 ක් එනම් සියයට 45 ක මිය ගොස් තිබුණි. 2019 පෙබරවාරි මාසය වන විට ඉතිරි ආනයන මවු සතුන් ගණන 533 ක් වූ අතර එම සතුන්ගෙන් ගැබ් ගත් සතුන් සංඛ්‍යාව 210 ක් එනම් සියයට 39 ක් වන අතර බිහිකළ පැටවුන් ගණන 116 ක් පමණක් බව නිරීක්ෂණය විය. | | මෙම ගොවීන් විසින් සපයන ලද තොරතුරු නිරවද්‍ය නොවේ. |
| (ඇ) | ගවයින් ආනයනය සඳහා ඇ.ඩො 16,739,589.77ක මුදලින් ඇ.ඩො 868,518.52 ක් එනම් රු.135,011,204 ක් තාක්ෂණික කළමනාකරණය සහ ධාරිතා වර්ධනය සඳහා විය ඉහත කරුණුවලට අනුව එම නියෝජිත ආයතනය මගින් තාක්ෂණික කළමනාකරණය නියමාකාරයෙන් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය. | පශු සම්පත් ක්ෂේත්‍රයේ විෂය දැනුම සහිත කණ්ඩායමක් මගින් ක්‍රමවත් අධ්‍යයනයක් සිදුකොට දීර්ඝ කාලීන සැලසුම් පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ හෝ අමාත්‍යාංශය යටතේ සකස් කිරීමට කටයුතු කල යුතුය. | තොරතුරු සත්‍ය නොවේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කිරි නිෂ්පාදනය වැඩි කිරීම මගින් කිරිපිටි ආනයනය අඩුකිරීමට හා දියර කිරි පරිභෝජනය වැඩිකිරීමට කිරි ගවයන් ආනයන ව්‍යාපෘතිය යටතේ 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු. මිලියන 6,435 ක විදේශ ණය ලබා ගෙන ගවයින් 9,500 ක් ආනයනය කර පශු සම්පත් මණ්ඩලයට හා අමාත්‍යාංශය යටතේ පෞද්ගලික ගොවීන් වෙත බෙදා හැර තිබුණි. එසේ වුවද, 2011 වර්ෂයේදී ආනයනික කිරිපිටි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 84.02 ක්, ක් වුවද එය 2018 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 99.03ක් දක්වා වැඩිවී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ ඉටුවී නොතිබුණි. | කිරි ගවයින් ආනයනය කිරීමට සමගාමීව, දියර කිරි පරිභෝජනය වැඩිකිරීමට හා කිරි පිටි ආනයනය අඩු කිරීමට ප්‍රතිපත්ති සකස් විය යුතු වීම. | තොරතුරු නිරවද්‍ය නොවේ |

### 3.10.3 මහජනතාවට හා රටට අයහපත් අයුරින් අනාරක්ෂිතව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1992 අංක 59 දරන සත්ව රෝග පනතේ 28 වගන්තියට අනුව රට තුළට එන සෑම සතෙකුම නිරෝධායන පරීක්ෂාවට ලක් කළ යුතු වුවත්, එසේ සිදු නොකොට නියැදියක් පමණක් නිරෝධායන පරීක්ෂාවට ලක් කිරීමෙන් පනතට පටහැනිව කටයුතු කළ බව නිරීක්ෂණය විය. මෙම ආනයනයේදී නිරෝධායනයන් මගින් අනාවරණය කර නොතිබූ රටේ නොමැති බී.වී.ඩී. වෛරසය ශරීරගතවී ඇති බව ආනයනික කිරිගව පශ්චාත් මරණ පරීක්ෂණයන්ගෙන් අනාවරණය විය. | පනත අනුව කටයුතු කළ යුතු වීම. | නිරවද්‍ය නොවේ. |
| (ආ) | 2017 වර්ෂයේ ආනයනය කල කිරි ගවයින් 1,994 හා 3,024 ක් පිළිබඳව ප්‍රධාන සත්ව | ක්ෂේත්‍රයේ විෂය දැනුම සහිත කණ්ඩායමක් මගින් | අදාළ කටයුතු සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය |

| | | | |
|---|---|---|---|
| | නිරෝධායන නිලධාරී සහ පශු වෛද්‍ය පර්යේෂණ අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කර තිබූ නිරෝධායන වාර්තාවට අනුව එම සතුන්ගෙන් නියැදියක් පරීක්ෂා කොට සතුන් සතු රෝග කාරක දේශීය ගවයින් වෙත සහ මනුෂ්‍යයන් වෙතද බෝවීමේ අවධානමක් ඇති බව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා තිබුණි. | ක්‍රමවත් අධ්‍යයනයක් සිදුකොට රටට හා මහජනතාවට හානියක් නොවන අයුරින් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වීම. | දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකර ඇත. |

## 3.10.4 ව්‍යාපෘතියේ සිදුවූ අලාභය හා පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ අසාර්ථකත්වය හේතුවෙන් 2018 වර්ෂයේ ආනයනයට නියමිත සතුන් 2500 ක් 2019 අගෝස්තු දක්වාම ආනයනය නැවත්වීමට සිදුවී තිබුණි. මේ තත්ත්වය මත 2018, 2019 හා 2020 වර්ෂවලදී ගෙන්වීමට නියමිත කිරි ගවයින් ප්‍රමාණය පිළිවෙලින් 2,500, ක් 7,500 ක් හා 5,000 ක් සඳහා 2018 මැයි මාසයේදී ගෙවා ඇති අත්තිකාරම් මුදල පිළිවෙලින් රු. මිලියන 291.61 ක් , රු. මිලියන 874.83 ක් හා රු.මිලියන 583.22 ක් ලෙස එකතුව රු.මිලියන 1,749.67 ක් විය. තවද එම මුදල් සඳහා පොලිය සහ විදේශ විනිමය අවප්‍රමාණය වීමේ අලාභය ඉදිරියේදී දැරීමට සිදුවන බව පෙන්වා දෙනු කැමැත්තෙමි. | තිරසාර සංවර්ධනයට අනුගතවීමට පශු සම්පත් ක්ෂේත්‍රයේ විෂය දැනුම සහිත කණ්ඩායමක් මගින් ක්‍රමවත් අධ්‍යයනයක් සිදුකොට දීර්ඝ කාලීන සැලසුම් පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ හෝ අමාත්‍යාංශය යටතේ සකස් කිරීමට කටයුතු කිරීම සුදුසු බව. | මෙම ව්‍යාපෘතිය අසාර්ථක ලෙස කිසිසේත්ම දැක්විය නොහැකි අතර ව්‍යාපෘතියට සම්බන්ධ ගොවීන් සහ බාහිර පාර්ශවයන් විසින් තවදුරටත් රජයෙන් සහන ලබා ගැනීමේ අරමුණින් ගෙන යන අනර්ථකාරී උත්සාහයන් නිසා ව්‍යාපෘතිය අසාර්ථක ලෙස පෙන්නුම් කර ඇත. නිසි උපදෙස් පරිදි ගොවිපල කළමණාකරණය කරන ගොවිපල අපේක්ෂිත ප්‍රතිඵල ලබා ඇති අතර එකම වර්ගයේ සතුන් විවිධ ගොවිපල වල සාර්ථක අසාර්ථක වීම කළමනාකරණයේ දුර්වලතාවයක් බව පැහැදිලිය. එමෙන්ම, රජය මගින් 6%ක සහන පොලියක්ද එක් සතකු වෙනුවෙන් රු.267,000 ක් ද අනෙකුත් අවශ්‍ය සේවාවන් ද සම්පාදනය කර ඇති අතර මේ සියලු ප්‍රතිලාභ ලබමින් තම ගොවිපලේ සත්‍ය තොරතුරු සඟවා රජයෙන් තවදුරටත් ලාභ ලබා ගැනීමට උත්සහ කරන ගොවීන් පිරිසක්ද මේ තුළ වෙති. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වේලාඩි ආයතනය විසින් ලබාදුන් රෝගී සතුන් 10 දෙනෙකු වෙනුවෙන් ගලේවෙල ගොවිපලක අයිතිකරුවකු වෙත ගොවියා ගෙවූ වටිනාකම වන රු. මිලියන 2ක් ගොවියාට නැවත ලබා දී තිබුණද, එම සතුන් සඳහා රජය වැය කල රු. මිලියන 3.21 ක මුදල රජයට අලාභයක් වී ඇති අතර එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රජය වැය කළ නමුත් රජයට අලාභයක් වූ මුදල අදාළ පාර්ශවයන්ගෙන් අයකරගත යුතු වීම. | එම ගොවිපල් කරු මුලින් ඉල්ලුම් කළ ප්‍රතිලාභියකු නොවන අතර මැණික්පාලම ගොවිපළෙහි රඳවා සිටි ඉතිරි සතුන් ඔහුගේ අනුදැනුම මත ලබා ගත් අයෙකි. ඔහුගේ ඉල්ලීම මත නැවත පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව මාගේ ඉල්ලීමක් මත වේලාඩි ආයතනය එම මුදල ගොවියාට ගෙවූ අතර එම සතුන් ආනයනයෙන් පසු ගැටළු ඇති වූ සතුන් බැවින් රජයට ගෙවීමක් සිදු කළ නොහැක. එම සතුන් ද එම ගොවි මහතාට ලබා දෙන ලදි. |

**4. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය තම අමාත්‍යාංශයට අයත් ආයතන සඳහා අරමුණු වශයෙන් දුගී බව නැති කිරීම, සාගින්න තුරන් කිරීම සහ යහපත් වැඩ පරිසරයක් තුළින් ආර්ථික සංවර්ධනයක් වශයෙන් හඳුන්වා දී තිබුණි. එසේ වුවද, පශු සම්පත් මණ්ඩලය එම අරමුණු අතරින් තම නිෂ්පාදනය තුලින් සාගින්න තුරන් කිරීම හා පෝෂණය නැංවීමේ අරමුණ හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට හැකි වන පරිදි සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදු කල යුතුය. | පිළිතුරු ලබා දී නොමැත |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පත්වීම් බලධාරියාගේ අනුමැතියකින් තොරව ලේකම් විසින් 2013 ජූනි මාසයේ සිට 2014 මාර්තු අතර පරිච්ඡේදය තුළ වී අලෙවි මණ්ඩලයට මුදාහැර තිබූ සංවර්ධන නිලධාරීන් 27 දෙනෙකුගෙන් 26 දෙනෙකුට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අමාත්‍යාංශයේ සේවයට වාර්තා කර නොතිබුණි. තවද තාවකාලිකව මුදා හැරීමේදී විශ්‍රාම දායක මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වූවද, එසේ අඩුකර ගැනීමක් සිදු නොකර 2016 හා 2017 වර්ෂ වල ගෙවන ලද සම්පූර්ණ වැටුප රු. මිලියන 24.30 ක්ම ප්‍රතිපූර්ණය කර තිබුණි. | ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ අංක 2.5.1 වගන්තිය ප්‍රකාරව කටයුතුකල යුතු වීම. | එවකට වී අලෙවි මණ්ඩලය මෙම අමාත්‍යාංශය යටතේ තිබූ ආයතනයක් වූ බැවින් අමාත්‍යාංශ සම්බන්ධීකරණ රාජකාරී වෙනුවෙන් මෙම නිලධාරීන් වී අලෙවි මණ්ඩලය වෙත අනුයුක්ත කර ඇත. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට අනුමත 666 ක තනතුරු සංඛ්‍යාවෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 ක් ඇතුළුව තනතුරු 33 ක පුරප්පාඩුවක් පැවතිණි. | රාජකාරී නිසි පරිදි ඉටු කිරීමට ප්‍රමාණවත් සේවක පිරිසක් අමාත්‍යාංශය තුල රඳවා ගැනීමට සියලු පුරප්පාඩු සඳහා හැකි ඉක්මනින් සේවකයින් බඳවා ගැනීම කළ යුතු වීම. | මාණ්ඩලික නිලධාරි තනතුරු පුරප්පාඩු 9 ඇතුලත බහුතර පුරප්පාඩු සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිලධාරින් ලබා ගත යුතු වූ තනතුරු වන බැවින් එම පුරප්පාඩු පුරවන ලෙස එම අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත. එහෙත් සමහර තනතුරු සඳහා වැඩ බැලීමේ පත්කිරීම් සිදු කර ඇත. |

# 4. කාර්යසාධන දර්ශක

## 4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| අනු අංකය | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100%-90% | 75%-89% | 50%-74% |
| 01 | දේශීය කිරි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (ලීටර් මිලියන) | | √ | |
| 02 | වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (බිත්තර/වසරකට) | √ | | |
| | වාර්ෂික ඒකපුද්ගල කුකුළු මස් පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (කි.ග්‍රෑම් වසරකට) | √ | | |
| 03 | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල වෙළෙඳාම වර්ධනයවීමේ ප්‍රතිශතය | | √ | |
| 04 | ග්‍රාමීය ප්‍රජාවගේ ආදායම වැඩිවීමේ ප්‍රතිශතය* | | | √ |

*අදාල ව්‍යාපෘතිවල ප්‍රතිලාභීන්ගේ නියැදියන්ගෙන් ලබාගත් තොරතුරු මත මෙම ගණනය කර ඇත

# 5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය/අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49 | 50%-74% | 75%-100% |
| (i) සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම<br><br>(ii) සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය හා යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම<br><br>(iii) සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායි හා යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම<br><br>(iv) තිරසර පරිභෝජනය හා නිෂ්පාදන රටා සුරක්ෂිත කිරීම | වසර 2020 වන විට දේශිය කිරි නිෂ්පාදනය ලීටර මිලියන 580 දක්වා ඉහල නැංවීම | දේශීය කිරි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (ලීටර් මිලියන) | | | √ |
| | වසර 2020 වන විට වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය 150 දක්වා ඉහල නැංවීම | වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (බිත්තර/වසරකට) | | | √ |
| | වසර 2020 වන විට වාර්ෂික ඒකපුද්ගල කුකුල් මස් පරිභෝජනය කිලෝ ග්‍රෑම් 10 දක්වා ඉහල නැංවීම | වාර්ෂික ඒකපුද්ගල කුකුල් මස් පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (කුකුල් මස් කිලෝ ග්‍රෑම් /වසරකට) | | | √ |
| | වසර 2020 වන විට විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල වෙළෙඳාම වර්ධනයවීමේ ප්‍රතිශතය 70% දක්වා වර්ධනය කිරීම | විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල වෙළෙඳාම වර්ධනයවීමේ ප්‍රතිශතය | | | √ |
| | වසර 2020 වන විට ග්‍රාමීය ප්‍රජාවගේ ආදායම වැඩිවීමේ ප්‍රතිශතය 10% කින් ඉහල නැංවීම * | ග්‍රාමීය ප්‍රජාවගේ ආදායම වැඩිවීමේ ප්‍රතිශතය | | √ | |

*අදාල ව්‍යාපෘතිවල ප්‍රතිලාභීන්ගේ නියැදියන්ගෙන් ලබාගත් තොරතුරු මත මෙම ගණනය කිරීමට නියමිතය.

### 5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය නඟාසිටුවීමේ අරමුණින් ක්‍රියාත්මකවන **කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති සංවර්ධනය කිරීම** ව්‍යාපෘතියේ සැපයුම් කොන්ත්‍රාත් ගිවිසුම 2019.02.27 අත්සන් කරන ලදි.

## 6. මානව සම්පත් පැතිකඩ

### 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 36 | 19 | 17 |
| තෘතීයික | 03 | 01 | 2 |
| ද්විතීක | 570 | 563 | 7 |
| ප්‍රාථමික | 53 | 33 | 20 |

### 6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ මානව සම්පත් හිඟය ආයතනයේ කාර්යසාධනයට අයහපත් අයුරින් බලපායි.

## 6.3. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු,000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| *Human Resource Management for senior public sector officials in Pakistan* | 01 | 2019.01.14<br>2019.01.21 | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් දැරීම | - | විදේශීය | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ දැනුම වැඩිදියුණු කර ගැනීම |
| *International programme on Management, (IUJ) in Japan* | 01 | 2019.05.27<br>2019.06.05 | 1,600.549 | - | විදේශීය | කළමනාකරණය පිළිබඳ දැනුම ලබාගැනීම |
| *Conference on Chemical, Agricultural, Biological and Environmental Science (ICCABES) Sydney, Australia* | 01 | 2019 මාර්තු 23 සිට 30 | 992.0 | - | විදේශීය | කිරි නිෂ්පාදනය සහ කිරිගව රෝග සම්බන්ධ දැනුම ලබාගැනීම |
| *Advance Thematic course on SPS, Geneva, - in Switzerland* | 01 | 2019.10.23<br>2019.11.15 | 153.0 | World Trade Organization ආයතනය මගින් | විදේශීය | සත්ත්ව නිෂ්පාදන ආනයනය හා අපනයනයට අදාළ ජාතික නීති සැකසීම පිළිබඳ දැනුවත් වීම |
| *Technical Assistance to the Modernization of Agriculture Programme (TAMAP) – stakeholder study tour in Vietnam* | 01 | 2019.08.11<br>2019.08.17 | 50.4 | යුරෝපීය සංගමය මගින් | විදේශීය | පශු සම්පත් සංවර්ධනයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය දැනුම ලබා ගැනීම |
| *Policy Planning and Project Management on Livestock Development for Livestock Officers - Japan* | 01 | 2019.08.24<br>2019.11.05 | 216.0 | ජපන් රජය මගින් | විදේශීය | පශු සම්පත් සංවර්ධනයට අදාළ ව්‍යාපෘති සැකසීමට දැනුම ලබා ගැනීම |
| *Global one health, Towards human, Animal and Plant health in Netherlands* | 01 | 2019.10.28<br>2019.11.08 | 95.2 | නෙදර්ලන්ත රජය මගින් හා අංශය මගින් | විදේශීය | මහජන සෞඛ්‍ය, සත්ත්ව සෞඛ්‍ය හා ශාක සෞඛ්‍ය ඒකාබද්ධ ප්‍රවේශයක් මගින් වසංගත රෝග මර්දනය පිළිබඳ අධ්‍යයනය |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු,000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම්/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| Dairy Sector Trade Mission to Netherlands | 02 | 2019.09.01 සිට 06 දක්වා | 1,165.69 | - | විදේශීය | කිරි ගව පාලනය සම්බන්ධයෙන් තාක්ෂණික දැනුම ලබා ගැනීම |
| Study Program on Dairy Development and Workshop Agri Bio –Victoria, in Australia | 01 | 2019.11.09 2019.12.01 | 165.6 | AgriBio, Victoria සහ Wellard Rural Exports මගින් | විදේශීය | කිරි ගව පාලනය සම්බන්ධයෙන් දැනුම ලබා ගැනීම |
| තොරතුරු තාක්ෂණ සේවයේ නොවන නිලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණය පිළිබඳ අත්‍යවශ්‍ය කුසලතා ලබාදීම | 01 | 2019.01.23 2019.01.24 | 13.0 | - | දේශීය | නව වැදගත් වන සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුම වැඩිදියුණු වීම |
| MS project මගින් ව්‍යාපෘති කළමනාකරණය | 01 | 2019.01.29 , 30, 31 | 18.0 | - | දේශීය | ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම |
| රාජ්‍ය සේවයේ වැටුප් සකස් කිරීමේ ක්‍රමවේදය | 02 | 2019.02.13 , 14, 15 | 36.0 | - | දේශීය | වැටුප් සැකසීම ක්‍රමවත් කර ගැනීම |
| ලිපි ගොනු කළමනාකරණය සහ රජයේ කාර්යාල පරිපාලනය | 02 | 2019.02.20 , 21, 22 | 36.0 | - | දේශීය | ලිපිගොනු කළමනාකරණය ක්‍රමවත් කර ගැනීම හා කාර්යාලීය කටයුතු ක්‍රමවත් කර ගැනීම |
| MS Access භාවිතා කරමින් දත්ත පද්ධති කළමනාකරණය | 02 | 2019.03.07 , 08 | 26.0 | - | දේශීය | කාර්යාලීය කටයුතු ක්‍රමවත් කර ගැනීම |
| Basic IT literacy and word processing using Microsoft word | 01 | 2019.03.12 , 13, 14 | 18.0 | - | දේශීය | මූලික පරිගණක දැනුම හා Microsoft word භාවිතය පිළිබඳ දැනුම ලබා ගැනීම |
| වැටුප් පරිවර්තන | 02 | 2019.03.18 , 19 | 17.0 | - | දේශීය | වැටුප් පරිවර්තනය පිළිබඳ දැනුම ලබා ගැනීම |
| රජයේ ප්‍රසම්පාදන කටයුතුවල ලංසු ඇගයීම | 02 | 2019.03.27 ,28, 29 | 36.0 | - | දේශීය | ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් දැනුම ලබා ගැනීම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු,000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම්/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| තොග සහ ගබඩා කළමනාකරණය | 01 | 2019.05.16 , 17 | 13.0 | - | දේශීය | ගබඩා කළමනාකරණය පිළිබඳ නව ක්‍රම යොදා ගැනීම |
| විදේශාධාර ව්‍යාපෘතිවල මූල්‍ය කළමනාකරණය | 01 | 2019.05.25 ,26 | 13.0 | - | දේශීය | කාර්යාලීය කටයුතු ක්‍රමවත් කර ගැනීම |
| MS Access භාවිතා කරමින් දත්ත පද්ධති කළමනාකරණය | 01 | 2019.07.02 , 03 | 13.0 | - | දේශීය | දත්ත සැකසීම පිළිබඳ දැනුම ලබා ගැනීම |
| ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 01 | 2019.07.04 සිට දින 10ක් | 26.0 | - | දේශීය | ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම |
| ලිපි ගොනු කළමනාකරණය සහ ආයතන සංග්‍රහයේ සාමාන්‍ය පරිපාලනය | 01 | 2019 ජුලි 23, 24,25 | 18.0 | - | දේශීය | කාර්යාලීය කටයුතු ක්‍රමවත් කර ගැනීම |
| වෘත්තිකයන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | 01 | 2019 අගෝ.-ඔක්. | 25.0 | - | දේශීය | ඉංග්‍රීසි භාෂා සන්නිවේදන කටයුතු වැඩි දියුණු වීම |
| තොරතුරු තාක්ෂණ සේවයේ නොවන නිලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණය පිළිබඳ අත්‍යවශ්‍ය කුසලතා ලබාදීම | 01 | 2019.08.20 ,21 | 13.0 | - | දේශීය | පරිගණක සන්නිවේදන තාක්‍ෂණික දැනුම වැඩි දියුණු වීම |
| රාජ්‍ය සේවයේ විනය පරිපාටි | 01 | 2019.08.20 ,21,22 | 18.0 | - | දේශීය | කාර්යාල කටයුතු ක්‍රමවත් වීම |
| කණිෂ්ඨ විධායක නිලධාරීන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | 01 | 2019.11.26 සිට මාස 03ක් | 25.0 | - | දේශීය | ඉංග්‍රීසි භාෂා සන්නිවේදන කටයුතු වැඩි දියුණු වීම |
| දෙමළ නිලධාරීන් සඳහා සිංහල භාෂා ප්‍රවීනතාවය | 01 | 2019.12.03 -10 දක්වා දින 06යි. | 5.0 | - | දේශීය | සිංහල භාෂා කථන හැකියාව වැඩි දියුණු වීම |

## 7. අනුකූලතා වාර්තාව

| # | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූලවේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූලවේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්(වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| **2** | **පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූලවේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූලවේ | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූලවේ | | |

| # | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූලවේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූලවේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA 1-2019 අනුව,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූලවේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4)උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3)ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූලවේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017දරණ වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |

| # | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූලවේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | 2020.01.01 දින සිට අමාත්‍යාංශය නව පරිශ්‍රයක ස්ථාපිතවීම හා කොරෝනා වසංගතය හේතුවෙන් කාර්යාලය වසා දමා තිබීම | |
| 8.4 | වාර්ෂික භාන්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල නොවේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදුකිරීම | අනුකූලවේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විකණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06ට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූලවේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූලවේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූලවේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූලවේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |

| # | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූලවේ | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූලවේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූලවේ | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූලවේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම්** | | | |
| 13.1 | කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූලවේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූලවේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූලවේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූලවේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූලවේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූලවේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූලවේ | | |

| # | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූලවේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූලවේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | මහජනතාව සමඟ සෘජුව කටයුතු නොකරන නිසා | |
| 18.2 | එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූලවේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශය වෙනස්වීම මත ප්‍රතිපාදන සලසා ගැනීමට නොහැකිවීම | |
| 19.3 | ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූලවේ | | |

| # | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කොට තිබීම | අනුකූලවේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූලවේ | | |